# 2023
# වාර්ෂික කාර්යසාධන වාර්තාව
## ජනාධිපති කාර්යාලය

# 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

**ආයතනයේ නම : ජනාධිපති කාර්යාලය**

**වැය ශීර්ෂ අංකය : 01**

## පටුන


| | අන්තර්ගතය | පිටු අංකය |
|---|---|---|
| **01 පරිච්ඡේදය** | - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 3 |
| **02 පරිච්ඡේදය** | - 2023 ප්‍රගතිය හා 2024 ඉදිරි දැක්ම | 6 |
| **03 පරිච්ඡේදය** | - 2023 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය<br>විගණකාධිපති නිරීක්ෂණ | 31 |
| **04 පරිච්ඡේදය** | - කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | 53 |
| **05 පරිච්ඡේදය** | - තිරසර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්යසාධනය | 93 |
| **06 පරිච්ඡේදය** | - මානව සම්පත් පැතිකඩ | 100 |
| **07 පරිච්ඡේදය** | - අනුකූලතා වාර්තාව | 108 |

# 01 පරිච්ඡේදය

## ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### දැක්ම

"වසර 2048 දී පූර්ණ සංවර්ධිත ශ්‍රී ලංකාවක්"

### මෙහෙවර

සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැංවීම උදෙසා වන සියලු අරමුණු සහ ඉලක්ක කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටුකර ගැනීම පිණිස නිවැරදි දිශානතියක් කරා රාජ්‍යය යොමුකිරීම

### අරමුණු

i. ගරු ජනාධිපතිතුමන්ගේ දැක්ම යථාර්ථයක් බවට පත්කරලීම සඳහා වඩාත් සඵලදායීව , කාර්යක්ෂමව හා සක්‍රිය ලෙස දායක වීම.

ii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා විවිධ අණපනත් මගින් ගරු ජනාධිපතිතුමන් විසින් ක්‍රියාත්මක කළයුතු බවට සඳහන් කාර්යයන් එම නීත්‍යානුකූල ප්‍රතිපාදන වලට අනුකූලව කාර්යක්ෂමව හා අනලස්ව ඉටුකිරීම සඳහා සහාය වීම.

iii. ජනාධිපති කාර්යාලය විසින් ඉටුකරන නියාමන හා සම්බන්ධීකරණ කාර්යයන් ඵලදායීව දියත් කිරීම සඳහා පියවර ගැනීම.

iv. අමාත්‍යාංශ හා විවිධ අංශ වලට අයත් සංවර්ධන කාර්යයන් සම්බන්ධීකරණය කිරීම හා අවශ්‍ය පරිදි පහසුකම් සැපයීම.

v. ජනාධිපති කාර්යාලයට අදාළ සියළු කළමනාකරණ ශ්‍රිත සමෝධානයක් සහිතව දියත් කිරීම.

vi. පරිපාලන අවභාවිතාවන් ,අතපසු වීම් හෝ ප්‍රමාදයන් නිසා සිදුවී ඇති මහජන පීඩා/ගැටළු අවම කිරීම.

vii. දිළිඳුබව තුරන් කිරීම හා සංවර්ධන ගැටළු සඳහා අවශ්‍ය උපායමාර්ගික මැදිහත්වීම් සිදුකිරීම.

viii. යාවත්කාලීන දත්ත ප්‍රවේශයක් ඇති කිරීම තුළින් ප්‍රජාව වෙත ප්‍රතිලාභ සැලසීම කාර්යක්ෂමව සිදු කිරීම.

ix. වඩා ඵලදායී අයුරින් රාජ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක වීම සඳහා දායක වීම තුළින් ප්‍රජාව වෙත ප්‍රතිලාභ සැලසීමේ ඉඩ ප්‍රස්තා වැඩි කිරීම.

x. මහජන සුබසාධනය සහතික කිරීම.

## 1.4 සංවිධාන සටහන



ගරු ජනාධිපතිතුමා
ජනාධිපති උපදේශකවරු
ජනාධිපති ලේකම්
කාර්ය මණ්ඩල ප්‍රධානී / ජාතික ආරක්ෂක උපදේශක
25 ජනාධිපති වෘත්තීය සමිති සම්බන්ධතා අංශය
24 ප්‍රජා කටයුතු අංශය
23 ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් අංශය
22 ආර්ථික ප්‍රතිසංස්කරණ ඒකකය
21 ඔම්බුඩ්ස්මන් - ජනාධිපති කාර්යාලය
20 උතුරු පළාත් සම්බන්ධීකරණ අංශය
19 අභ්‍යන්තර විගණන අංශය
18 ජනාධිපති මාධ්‍ය අංශය
17 ගිණුම් හා මූල්‍ය අංශය
16 මානව සම්පත්, පාලන හා ප්‍රවාහන අංශය
15 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ ඩිජිටල්කරණ අංශය
14 නීති කටයුතු අංශය
13 ජනාධිපති අරමුදල
12 මහජන සම්බන්ධතා අංශය
11 පාර්ලිමේන්තු හා අමාත්‍ය මණ්ඩල කටයුතු අංශය
10 කාර්යසාධන ඵලදායිතා සහ ඉඩම් අංශය
9 ආයතන සම්බන්ධීකරණ අංශය
8 ආහාර සුරක්ෂිතතා හා යටිතල පහසුකම් ව්‍යාපෘති සංවර්ධන අංශය
7 ආර්ථික කටයුතු අංශය
6 ක්‍රමෝපායක කටයුතු අංශය
5 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ව්‍යවස්ථාපිත කටයුතු අංශය
4 ජනාධිපති ලේකම් කාර්යාංශය
3 විශේෂ ව්‍යාපෘති අංශය
2 ජනාධිපති පෞද්ගලික ලේකම් කාර්යාලය
1 කාර්යය මණ්ඩල ප්‍රධානී අංශය

## 1.5 ජනාධිපති කාර්යාලය යටතේ පවතින ප්‍රධාන අංශ

1) ජනාධිපති කාර්යය මණ්ඩල ප්‍රධානී අංශය
2) ජනාධිපති පෞද්ගලික ලේකම් කාර්යාලය
3) ජනාධිපති ලේකම් කාර්යාංශය
4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා ව්‍යවස්ථාපිත කටයුතු අංශය
5) පාර්ලිමේන්තු හා අමාත්‍ය මණ්ඩල කටයුතු අංශය
6) මානව සම්පත් කළමනාකරණ, පාලන හා ප්‍රවාහන අංශය
7) ආර්ථික කටයුතු අංශය
8) ක්‍රමෝපායික කටයුතු අංශය
9) ආහාර සුරක්ෂිතතා හා යටිතල පහසුකම් ව්‍යාපෘති සංවර්ධන අංශය
10) කෘෂිකර්ම ඵලදායිතා සහ ඉඩම් අංශය
11) ආයතන සම්බන්ධීකරණ අංශය
12) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ ඩිජිටල්කරණ අංශය
13) උතුරු පළාත් සම්බන්ධීකරණ අංශය
14) අභ්‍යන්තර විගණන අංශය
15) ප්‍රජා කටයුතු අංශය
16) ගිණුම් හා මූල්‍ය අංශය
17) නීති කටයුතු අංශය
18) විශේෂ ව්‍යාපෘති අංශය
19) ආර්ථික ස්ථායිකරණ අංශය
20) ජනාධිපති මාධ්‍ය අංශය
21) මහජන සම්බන්ධතා අංශය
22) ජනාධිපති වෘත්තීය සමිති සම්බන්ධතා අංශය
23) ඔම්බුඩ්ස්මන් කාර්යාලය
24) ජනාධිපති අරමුදල
25) ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් අංශය

## 1.6 ජනාධිපති කාර්යාලය යටතේ පවතින අරමුදල්

1) ජනාධිපති අරමුදල

## 1.7 විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ. ව්‍යාපෘතියේ නම: ආහාර සහනාධාර වැඩසටහන

ආ. දායක නියෝජිත ආයතනය: එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන

ඇ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම: රු.මි. 23,360

ඈ. ව්‍යාපෘති කාලසීමාව: 2023 - 2027

# 02 පරිච්ඡේදය

# 2023 ප්‍රගතිය හා 2024 ඉදිරි දැක්ම

## 2.1 ප්‍රගතිය 2023

### 2.1.1 ප්‍රතිපත්තිමය මග පෙන්වීම්

තිරසාර ආර්ථික අභිවෘද්ධියක් අත්පත්කර ගැනීම අරමුණු කර ගත්, තරඟකාරී, විවෘත සහ සමාජ සාධාරණත්වය මත පදනම්ව සිදු කරන සංවර්ධනයකට මඟපෙන්වන වැඩපිළිවෙලක් යටතේ ශ්‍රී ලංකාව, වසර 2048 නිදහසේ ශත සංවත්සරයට ළඟා වන විට දියුණු ආර්ථිකයක් ඇති රටක් බවට පත්වීම රජයේ ඉලක්කය ලෙස ප්‍රකාශ කර ඇත.

2022 වර්ෂයේ සිට ගන්නා ලද මූලාරම්භයන් ඉදිරියට පෙළගස්වමින් 2023 වර්ෂයේ සිට එළඹි මධ්‍යකාලීන රාමුව තුළ ක්‍රියාත්මක වන ක්‍රමෝපායික මාර්ග සිතියමෙහි ප්‍රධාන තේමාත්මක ක්ෂේත්‍ර පහත පරිදි දැක්වේ.




#### 2.1.1.1 සාර්ව ආර්ථික ස්ථාවරත්වය තහවුරු කිරීම

2022 වර්ෂයේ ඇතිවූ ආර්ථික අර්බුදය සමනය කරගැනීම සහ ආර්ථිකය ස්ථාවර කරගැනීම සඳහා පියවර රාශියක් වත්මන් ජනාධිපතිතුමා ජනාධිපති ධුරයට පත්වූ 2022 ජූලි මස සිට, නව රජය යටතේ රටේ සමස්ත ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා සාර්ව ආර්ථික රාමුවෙහි පහත වෙනස්කම් සිදු කරමින් පවතින අතර මේ වන විට අත්කරගත් ප්‍රගතිය පහත පරිදි වේ.

- **ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම (Extended Fund Facility-EFF)**

ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය ඇති කිරීම සහ රාජ්‍ය ණය තිරසර බව ඇති කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන ප්‍රතිසංස්කරණ කිහිපයක් මත රැඳෙන විස්තරාත්මක ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ලෙස සැලසුම් කර ඇති අතර රාජ්‍ය මූල්‍ය

ඒකාග්‍රතාව, වඩාත් අවධානමට පාත්‍ර විය හැකි ජනතාව ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම, මිල ස්ථායිතාවය ඇති කිරීම සඳහා බහුවිධ උපායමාර්ගයක්, ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ උපායමාර්ගයක් සහ නම්‍යශීලී විනිමය අනුපාතිකයක් යටතේ ජාත්‍යන්තර සංචිත යළි ගොඩනැංවීම සහ දූෂණය අවම කිරීම සඳහා විසඳුම් ලබාදීම ඉලක්ක කරගත් පුළුල් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඇතුළත් වේ.

ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ශ්‍රී ලංකාව විසින් 2022 වර්ෂයේදී එළඹි මාස 48 ක විස්තීරණ ණය පහසුකම් වැඩසටහනෙහි ගිවිසුමට අනුව (එ.ජ. ඩො. බි. 3) 2023 වසරේ මාර්තු මස 20 වන දින විස්තීර්ණ ණය පහසුකම අනුමත කරන ලදී. ඒ අනුව ලබාදුන් දෙවන වාරිකයද ඇතුලත්ව සමස්ත විදේශ ගැනුම් හිමිකම් (වි.ගැ.හි./ SDR) සමස්ත වටිනාකම වි.ගැ.හි. මිලියන 508ක් (එ.ජ. ඩොලර් මිලියන 670ක් පමණ) ලබාදී ඇත. තවද,2024 මාර්තු මස 21 වන දින මෙම ණය වැඩසටහනෙහි දෙවන සමාලෝචනය අවසන් කිරීම සඳහා ආර්ථික ප්‍රතිපත්ති මට්ටමේ එකගතාවයකට එළැඹෙන ලදී.

- **රාජ්‍ය ආදායම ඉහළ නැංවීම හා වියදම් සමාලෝචනය**

බදු ව්‍යුහය සංශෝධනය කිරීම සහ බදු විෂමතා නිවැරදි කිරීම සඳහා 2023 අයවැය මඟින් සංශෝධිත බදු නීති, 2023.01.01 සිට ක්‍රියාත්මක වන අතර. එමගින් ඉදිරි කාලය තුළ දී සාර්ව ආර්ථික සමතුලිතාව තවදුරටත් යථාවත් කිරීමට අපේක්ෂා කෙරේ.

2023 වසරේ රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා ක්‍රියාත්මක කළ කැපීපෙනෙන පියවරයන් කිහිපයක් පහත දැක්වේ.

- දැඩි චක්‍රලේඛ උපදෙස් ඇතුළු වියදම් පාලනය සහ තාර්කිකරණ පියවර
- තෝරාගත් අරමුණු සඳහා රජයේ සේවකයින්ට වසර 5ක වැටුප් රහිත නිවාඩු ලබා දීම
- රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් නිලධාරී කමිටුවක් පත් කරන ලද අතර රාජ්‍ය සේවය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාම සඳහා සිදු කළ යුතු අත්‍යවශ්‍ය බඳවා ගැනීම් සම්බන්ධයෙන් ප්‍රමුඛතා හඳුනාගෙන ඒ සඳහා කාලරාමු නිර්දේශ කිරීම සහ දැනට රාජ්‍ය සේවය තුළ පැන නැඟී ඇති ගැටලු සඳහා යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම කමිටුව මගින් සිදු කරනු ලබයි.
- 2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත බලාත්මක කර පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පිහිටුවා ඇත.
- ඉහළ වියදම් සහිත අමාත්‍යාංශ 10ක් වියදම් සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව (PERC) පිහිටුවීම
- බැංකු අංශයේ ප්‍රතිසංස්කරණ සඳහා 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත බලාත්මක කිරීම වැනි මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි පිටුවහලක් වන ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ සිදු කර ඇත.

ඉහත ක්‍රමෝපායයන්ද ඇතුළුව සිදු කරන ලද ප්‍රතිසංස්කරණ මගින් අත්පත් කරගත් ප්‍රතිඵල පහත පරිදි දැක්විය හැකිය.

### i. උද්ධමන පාලනය

2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සියයට 69.8 ක්වූ ඉතිහාසයේ ඉහළම උද්ධමන අගය වාර්තා කිරීමෙන් අනතුරුව වසරක් තුළ 2023 සැප්තැම්බර් මාසයේ දී සියයට 1.3 ක් පමණ වූ ඉතා අවම අගයක් ළඟා කර ගැනීමට හැකිවිය.

ඉතා ඉහළ අගයක පැවති උද්ධමනය වසරක් වැනි කෙටිකාලයක් තුළ තනි ඉලක්කමක මට්ටමකට ගෙන ඒම මඟින් ආර්ථිකයේ පාර්ශවකරුවන්ගේ ඉදිරි උද්ධමන අපේක්ෂා බොහෝ දුරට ඉතා හිතකර මට්ටමක පවතින නමුත් උද්ධමන පීඩනය පාලනය කිරීමට සහ සාර්ව ආර්ථික ස්ථායීතාවට සහය වීම සඳහා අඛණ්ඩ අධීක්ෂණය වැදගත් වේ.

**ii. ආර්ථිකයේ කැපී පෙනෙන වර්ධනය**

2022 වර්ෂයේ සිව්වන වන කාර්තුවේ වාර්තාගත සෘණ ආර්ථික වර්ධනයකට (- 12.4 %) පසුව 2023 වසරේ තුන්වන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සුළු ධන වර්ධනයක් (1.6%) වාර්තා කරන ලදි. තවද, මෙම වර්ධනය තවදුරටත් ඉහලට ඔසවා තබමින් 2023 සිව්වන කාර්තුවේදි සියයට 4.5 ක ධන ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීමට හැකි විය. 2022 වර්ෂයෙහි සමස්ත වාර්ෂික වර්ධනය වූ සියයට සෘණ 7.3 ට සාපේක්ෂව 2023 වර්ෂයේදී සමස්ත වාර්ෂික වර්ධනය සියයට සෘණ 2.3 ක් ලෙස කැපී පෙනෙන වර්ධනයක් අත්පත් කරගෙන ඇත. එමෙන්ම 2022 වර්ෂයෙහි කෘෂිකාර්මික, කාර්මික සහ සේවා අංශයන්හි වාර්තා වූ පිළිවෙලින් සියයට සෘණ 4.2 , සෘණ 16 සහ සෘණ 2.6 ක වර්ධනයට සාපේක්ෂව 2023 වර්ෂයෙහිදී කෘෂිකාර්මික, කාර්මික සහ සේවා අංශයන්හි පිළිවෙළින් සියයට ධන 2.3, සෘණ 9.2 සහ සෘණ 0.20 ක අගයක් වාර්තා කරමින් වර්ධනයේ මාවතට අවතීර්ණව ඇත. එමෙන්ම 2022 වර්ෂයේදී වාර්තා කළ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය එ.ජ.ඩොලර් 3,464 හි සිට එ.ජ.ඩොලර් 3,830 ක් දක්වා ඉහල නැංවී ඇත. සමස්තයක් ලෙස 2024න් වර්ෂයේදී ආර්ථිකය ධන අගයක පවත්වාගැනීමට හැකිවනු ඇති බවට මහ බැංකුව පුරෝකථනය කර ඇත.

**iii. විදේශ අංශයේ වර්ධනයන්**

2022 වසරේදී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 5185 ක් වූ වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟයට සාපේක්ෂව 2023 වසරේදි වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය එ.ජ.ඩොලර් මිලියන 4900 දක්වා පහත වැටුණු අතර මෙම අගය 2010 වර්ෂයට පසුව වාර්තාගත වූ අඩුම අගය වේ. මෙම තත්වයට අපනයන ආදායමට සාපේක්ෂව ආනයන වියදම පහල යාම බොහෝදුරට බලපා ඇති බවත් ආනයන සීමා කිරීම් මෑත කාලීනව ලිහිල් කිරීම හමුවේ වුවද, ආනයන අඛණ්ඩව පහළ මට්ටමෙ පැවතුනි බවත් මහා බැකුව මගින් පෙන්වා දි ඇත.

එමෙන්ම, 2022 වර්ෂයේදී වාර්තා වූ එ.ජ.ඩොලර් බිලියන 3.8 ක පමණ වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට සාපේක්ෂව, 2023 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 6.0 ක පමණ ශක්තිමත් අගයක් වාර්තා කරන ලදී. ආර්ථික, දේශපාලන සහ ආරක්ෂක ස්ථාවරභාවය පවත්වාගැනීම වෙනුවෙන් ඉහළ අවධානයක් යොමු කිරීම හේතුවෙන් සංචාරක පැමිණීම්වල කැපීපෙනෙන වර්ධනයක් වාර්තා වූ අතර සංචාරක පැමිණීම්වල 2022 වසරේ දී වාර්තා වූ අගයට සාපේක්ෂව දෙගුණයකටත් වඩා වර්ධනය වීම මඟින් 2023 වසරේදී සංචාරක පැමිණීම් 1,487,303ක් වාර්තා කරමින් අඛණ්ඩව යථා තත්ත්වයට පත් විය. ඒ අනුව සංචාරක ඉපයීම් ද 2022 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,136ට සාපේක්ෂව 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,068ක් දක්වා වැඩි විය. ඉන්දියාව, රුසියාව, එක්තසත් රාජධානිය, ජර්මනිය සහ චීනය යන රටවලින් 2023 වර්ෂයේ වැඩිම සංචාරක පැමිණීම් වාර්තා විය.

තවද, රාජය සුරැකුම්පත් වෙළඳපොළහි සහ කොටස් වෙළඳපොලෙහි විදේශීය ශුද්ධ ආයෝජන ලැබීම් වාර්තා විය. එමෙන්ම දේශීය විදේශ විනිමය වෙළඳපොලෙන් ශ්‍රී ලංකා මහා බැංකුව සිදුකළ ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම්, ජා. මු. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් යටතේ වන ණය මුදාහැරීම් සහ බහුපාර්ශ්වික මූල්‍ය ආයතනවලින් ලද විදේශ මූල්‍යකරණය මගින් 2022 වසරෙහි අවසානයට එ.ජ. ඩොලර් බිලියන 1.9 ක පමණ පැවති දළ නිල සංචිත 2023 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 4.4ක පමණ අගයක් දක්වා කැපීපෙනෙන ලෙස වර්ධනය විය.

එමෙන්ම 2022 වසර අවසානයේදී එ.ජ. ඩොලරයට සාපේක්ෂව 363.11 ක අගයක පැවති ශ්‍රී ලංකා රුපියල, 2023 වසර අවසානයේදී දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව 323.92 ක් අගයක් දක්වා සියයට 12.1 කින් අති ප්‍රමාණය විය.

### 2.1.1.2 ප්‍රශස්ත ආර්ථික පාලනයක් සහ ආර්ථිකමය තීරණ ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනය

ආර්ථිකයේ ව්‍යුහාත්මක දුර්වලතා ඉවත් කිරීම සහ ආර්ථික පාලනය යහපත් කරගැනීම මඟින් රාජ්‍ය ආයෝජනයන්හි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, දූෂණ අවදානම් අවම කිරීම සහ මූල්‍ය විනයට සහාය වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අඛණ්ඩව ගනිමින් පවතී.

- **ආර්ථිකමය ප්‍රත්‍යස්ථිතිය / ඔරොත්තු දීමේ හැකියාව (Economic Resilience) ඉහළ නැංවීම**
    - ඉදිරි වසර 25 සඳහා ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් අනුව සකස් කරන ලද නිශ්චිත මාර්ග සිතියමකට අනුව කටයුතු කිරීමටත් එහි නිවැරදි රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා පූර්ණ ස්වාධීනත්වය සහිත පාර්ලිමේන්තු අයවැය කාර්යාලයක් පිහිටුවීම වෙනුවෙන් 2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාල පනත 2023 ජුනි මස 27 වන සිට බලාත්මක කර ඇත.
    - විචක්ෂණශීලී වියදම් කළමනාකරණයක් සඳහා ශුන්‍ය පාදක අයවැය (Zero Based Budgeting) ක්‍රමවේදය මීළඟ අයවැය සකස් කිරීමේදී ක්‍රියාවට නැංවීම. මේ සඳහා වැඩිම අයවැය ප්‍රතිපාදන ලැබෙන අමාත්‍යාංශ 10 සඳහා රාජ්‍ය වියදම් සමලෝචන කමිටු (Public Expenditure Review Committee ); අංක 23/0256/604/030 හා 2023.02.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීනතාවයක් දක්වන සාමාජිකයින් 30 දෙනෙකු පත් කර ඇත. මේ වනවිටත් රාජ්‍ය වියදම් සමාලෝචනය කිරීමේ කමිටු (Public Expenditure Review Committee - PERC) මගින් කමිටු 7ක අවසන් වාර්තා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර 2024 අයවැය සඳහා එම වාර්තාවල නිර්දේශ සලකා බලා ඇත.
    - මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සම්බන්ධයෙන් ස්වාධීනත්වය ඉහළ නැංවීම සහ වඩාත් ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට ඉඩ සැලසීම පිණිස 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත 2023 සැප්තැම්බර් 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බලාත්මක කිරීමට පියවර ගෙන ඇති අතර පනත ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලන මණ්ඩලයෙහි හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සාමාජිකයන් පත් කර ඇත.
    - දූෂණයට එරෙහිව එක්සත් ජාතීන්ගේ සම්මුතීන් සමග අනුගත වෙමින් දූෂණ විරෝධී නීති රාමුවේ සැලකිය යුතු වැඩිදියුණු කිරීම් සහ දූෂණයට මුහුණ දීම සඳහා සංවිධානාත්මක විධිවිධාන හඳුන්වා දෙමින් 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත (ACAACA) 2023 අගෝස්තු මස 08 වන දින සිට බලාත්මක කිරීමට පියවර ගෙන ඇති අතර ශ්‍රී ලංකාවේ නීතිමය රාමුව ජාත්‍යන්තර ප්‍රශස්ත ප්‍රමිතීන් සමඟ පෙළගැස්වීම සඳහා මෙම පනත බොහෝ දුරට උපකාරී වනු ඇත.
    - කොළඹ වරාය නගරයෙහි සංවර්ධනය දළ දේශීය නිෂ්පාදිතයට මෙන්ම සෘජු විදේශ ආයෝජන ගලා ඒමටත් නව රැකියා උත්පාදනයත් සඳහා සැලකිය යුතු ලෙස බලපානු ඇත. මෙහි නීතිමය කාර්යයන් ලෙස 2023 අංක 01 දරන කොළඹ වරාය නගර රීති (තීරු-නිදහස් මෙහෙයුම්), නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

– එසේම, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව විසින් යෝජනා කරන ලද, උපාය මාර්ගික වැදගත්කමක් ඇති ව්‍යාපාර (BSI) ලෙස නම් කර ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ලබා දීම සඳහා වන මාර්ගෝපදේශ අනුමත කරන ලදී. මෙය 2023 අගෝස්තු 04 වැනි දින අංක 2343/60 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

- **රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ**

2017 සිට 2022 දක්වා වසර 5 ක කාලය තුළ උපායමාර්ගික වශයෙන් හඳුනාගෙන ඇති රාජ්‍ය ව්‍යවසාය 52ක් රුපියල් බිලියන 443ක පාඩුවක් ලබා ඇත. මෙම රාජ්‍ය ව්‍යවසාය අතරින් තෝරාගත් ව්‍යවසාය 08ක් සඳහා ප්‍රතිසංස්කරණ ගෙන ඒමේ පරමාර්ථය සහිතව මහජනතාවට සාධාරණ මිලට ගුණාත්මක භාණ්ඩ හා සේවා ලබා දීම, වඩාත් තරගකාරී ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම සහ එම ව්‍යවසාය මඟින් රජයට සිදුවන මූල්‍යමය බර අවම කිරීම වෙනුවෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ යටතේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය ස්ථාපනය කර ක්‍රියාත්මක වෙමින් පවතී.මෙයින් රාජ්‍ය ව්‍යවසාය 7 ක් සඳහා සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර ග්‍රාහක සමාගම ලියාපදිංචි කර ගනුදෙනු උපදේශකයින් පත් කර ඇති අතර රාජ්‍ය ව්‍යවසාය 3ක් සඳහා අභිලාශ ප්‍රකාශන (EOI) ලැබී ඇත.

- **විදුලිබල සහ බලශක්ති අංශයේ ප්‍රතිසංස්කරණ**

– සේවා සැපයුමෙහි මූල්‍යමය තිරසාරබව තහවුරු කිරීම පිණිස ප්‍රතිසාධන මිල ක්‍රියාත්මක කිරීම, ඉන්ධන මිල සූත්‍රය, අවසාන පරිශීලක විදුලි ගාස්තු ගැලපීම සහ විදුලි සහනාධාරය නිවැරදිව මැනීමට තොග සැපයුම් ගණුදෙණු ගිණුම (BSTA) වැඩිදියුණු කිරීම වැනි ක්‍රියාමාර්ග ගැනීම.

– බලශක්ති ක්ෂේත්‍රයට තරඟකාරිත්වය ගෙන ඒම හරහා බලශක්ති සුරක්ෂිතතාව සහතික කිරීම; සියලුම ව්‍යාපාරික අංශ ආවරණය වන පරිදි ක්ෂේත්‍රයේ තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා 2022 අංක 27 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත සම්මත කරන ලදී. ඉන්ධන බෙදා හැරීම සම්බන්ධයෙන් තවත් සැපයුම්කරුවන් හඳුන්වා දීමට පියවර ගෙන ඇත (Sinopec Fuel Oil Lanka (Private) Limited , United Petroleum, Shell PLC - RM Parks). මේ යටතේ සිනොපෙක් සමාගම 2023 අගෝස්තු මස අග සිට මෙරට තම මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇත.

- **දේශගුණික අභියෝග ආමන්ත්‍රණය කිරීම**

ජාතික දේශගුණික විපර්යාස පනත් කෙටුම්පත සංශෝධනය පිණිස වැඩිදුර කරුණු ඇතුළත් කිරීම වෙනුවෙන් අදාළ මූලික පාර්ශවයන් වෙත යොමු කර ඇත. අඩු කාබන් සංවර්ධන ක්‍රියාමාර්ග, හරිතාගාර වායු විමෝචනය කළමනාකරණය කිරීම සහ නියාමනය කිරීම, දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් වලට අනුවර්තනය වීම, දේශගුණික විපර්යාස සම්බන්ධ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කිරීම, අධීක්ෂණය කිරීම සහ දේශගුණික විපර්යාස ආශ්‍රිත මූල්‍ය, ව්‍යාපෘති සහ වැඩසටහන් අධීක්ෂණය සඳහා පහසුකම් සැලසීම කෙරෙහි අවධානය යොමු කෙරේ. තවද දේශගුණික විපර්යාස කාර්යාලය ආයතන ගත කිරීම සහ දේශගුණික විපර්යාස සම්බන්ධ ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

- **තාක්ෂණය සහ ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කිරීම**

  - කෘතිම බුද්ධි තාක්ෂණය (AI) ආර්ථික සංවර්ධනයට හා සමාජීය ප්‍රගමනයට දායක කර ගැනීම පිණිස, කෘතිම බුද්ධිය (AI) සංවර්ධනය කිරීම සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සහ රාජ්‍ය නිලධාරීන්ගෙන්ද සමන්විත විශේෂඥ කමිටුවක් 2023 ජුනි මස ජනාධිපති කාර්යාලය යටතේ පත් කරන ලද අතර මෙම උපාය මාර්ගයට සමගාමීව සකස් කල ධවල පත්‍රිකාවක් 2024 මාර්තු මස ඉදිරිපත් කරන ලදී. යෝජිත උපායමාර්ගික සැලැස්ම 2024 මැයි මස අවසන් වන විට ඉදිරිපත් කිරීමට යෝජිතය.
  - ඩිජිටල් ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ඩිජිටල් ආර්ථික උපායමාර්ගය (DIGIECON) 2023 ඔක්තෝබර් මාසයේදී දියත් කරන ලදී.
  - ඩිජිටල් තාක්ෂණ පනත සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර පනත සම්මත වීමෙන් පසුව දත්ත ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීමත්, විද්‍යුත් ක්‍රමවේද මගින් ගෙවීම් ප්‍රවර්ධනය කිරීමත්, බදු පරිපාලනය සඳහා ඩිජිටල් වේදිකාවක් සකස් කිරීමට සහාය වීමත්, පසු අස්වනු නාස්තිය අවම කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය ව්‍යාප්ත කිරීමත් වෙනුවෙන් පියවර ගනු ඇත.

- **ඉඩම් ප්‍රතිසංස්කරණ**

ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා උපකාරී වන හා පහසුව සැලසෙන ඉඩම් ප්‍රතිපත්තියක් නොමැති වීම හේතුවෙන් ඉඩම් හඳුනා ගැනීමේ, අත්පත් කර ගැනීමේ හෝ බදු පදනමින් ලබා ගැනීමේදී ගැටළු හා ප්‍රමාදයන් ඇතිවේ. එම ගැටළු කඩිනමින් ආමන්ත්‍රණය කිරීම පිණිස, නව ඉඩම් අත්පත්කර ගැනීමේ පනත් කෙටුම්පතක් හඳුන්වාදීම, ජාතික ඉඩම් කොමිසම ස්ථාපිත කිරීම සඳහා මූලික පනත් කෙටුම්පත සකස් කර අමාත්‍ය මණ්ඩලයට යොමු කිරීම, ඉඩම් බැහැර කිරීමේ මූලික කටයුතු ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් පමණක් සිදු කිරීම සහ රජයේ ඉඩම් භාරය ස්ථාපිත කිරීම පිළිබඳ කටයුතු ආරම්භ කර ඇත.

- **කෘෂිකාර්මික නවීකරණය**

  - කෘෂිකාර්මික නවීකරණ උපායමාර්ගික රාමුවක් තේමාත්මක ක්ෂේත්‍ර 16ක් යටතේ සකස් කෙරෙන අතර වසර 25 ක කාල රාමුවක් තුල සහ අදියර තුනකින් (අදියර I - 2023-2028, අදියර II- 2029-2038, අදියර III - 2039-2048) ක්‍රියාත්මක කිරීමට යෝජිතය. මේ සඳහා ප්‍රතිපත්ති කෙටුම්පත් කමිටුවක් පත් කර ඇති අතර එම වැඩපිළිවෙල ඉහළ ප්‍රමුඛතාවයකින් සහ මනා සම්බන්ධීකරණයකින් යුතුව ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ජනාධිපති කාර්යාලයේ කෘෂි නවීකරණ ලේකම් කාර්යාලය සඳහා සාමාජිකයන් පත් කර ඇත.
  - වර්තමානයේ කිරි කර්මාන්තය තුළ පවතින ඌණතාවයන් සහ ආනයන මත යැපීම යන තත්වයේ සිට ස්වයංපෝෂිත භාවයට පරිවර්තනය කල හැකිවන අයුරින් ඉන්දියානු රජය සමඟ රාජ්‍ය-රාජ්‍ය (G2G) සහයෝගීතා රාමුවක් යටතේ, තෝරාගත් NLDB ගොවිපළවල මෙහෙයුම් වැඩිකර වාණිජමය ව්‍යාපාරයක් ස්ථාපිත කිරීමට කටයුතු කරමින් පවතින අතර මේ පිළිබඳ ඉන්දියානු රජය සමඟ ඒකාබද්ධ ප්‍රකාශනයක් 2023 ජුලි 21 දින අත්සන් කරන ලදී.

- කෘෂිකර්ම අංශය නවීකරණය කිරීමට අදාළව ජාතික ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කිරීම හා ඒ සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීම; ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය සකස් කර ඇති අතර බෝග කාණ්ඩ 15 ක් ඔස්සේ මාර්ග සැලැස්ම (Road Map) සකස් කිරීම සහ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පිහිටුවන ලද අනු කමිටු වාර්තා සමාලෝචනය කිරීම සිදු කෙරේ.
- කුරුඳු කර්මාන්තය සඳහා නව දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට අදාළව 2023.08.14 දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක 23/1501/601/050 මඟින් කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමට පියවර ගෙන ඇත.

- **ශ්‍රී ලංකාව වසර පුරාම ක්‍රියාත්මක සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීම**

  - මෙරට සංචාරක ව්‍යාපාරයේ ප්‍රධාන ඉලක්කය වනුයේ සංචාරක පැමිණීම් මිලියන 2 දක්වා වැඩි කර ඩොලර් බිලියන 5 කට වැඩි ආදායමක් උපයා ගැනීමයි. මෙහිදී ඉන්දියාව, රුසියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය සහ චීනය ඇතුළු ප්‍රධාන වෙළඳපොළ නවයක් කෙරෙහි අවධානය යොමු කරන අතරම ජපානය, කොරියාව, ජෝර්ජියාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය සහ නැගෙනහිර යුරෝපයේ රටවල් වැනි නව වෙළඳපොළ අත්පත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.
  - ජනාධිපති කාර්යාලය යටතේ පත් කරන ලද සංචාරක ප්‍රතිපත්ති කමිටුව විසින් තිරසර සංචාරක ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම පිණිස ජාතික සංචාරක ප්‍රතිපත්තිය සහ ක්‍රමෝපායික සැලැස්ම සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මේ සඳහා සියලු පාර්ශ්වයන්හි අදහස් ලබාගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත.
  - නුවරඑළිය සංචාරක ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ කමිටුව (Committee to expedite the preparation of the Nuwara Eliya Tourism Development Master Plan) මඟින් එම ප්‍රධාන සැලැස්ම සකස් කිරීමේ කටයුතු අවසන් අදියරෙහි පවතී.

### 2.1.1.3 ශ්‍රී ලංකා ආර්ථිකයේ තරගකාරීත්වය වැඩි දියුණු කිරීම

ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා ගෙන ඇති දැඩි ක්‍රියාමාර්ග යටතේ, වර්ධන ප්‍රවර්ධක බලවේග විශාල වශයෙන් ශක්තිමත් කිරීමට රජය අපේක්ෂා කරයි.

- **හිතකර ආයෝජන පරිසරයක් නිර්මාණය කිරීම**

ආයෝජකයින්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා සාර්ව ආර්ථික මට්ටමේ මූලපිරීම් සහ ක්‍රියාමාර්ග සිදු කරන අතරතුර, අවම පිරිවැයක් තුළ - අවම කාලයකින් - සරල ක්‍රියාපටිපාටියක් සහිතව අවශ්‍ය සේවා සැපයීම සඳහා අදාළ ක්‍රියාවලීන් පහසු කිරීමට සහ ආයතන වඩාත් විනිවිදභාවයෙන් කටයුතු කිරීම සඳහා ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම තුළින් ව්‍යාපාර සක්‍රීය පරිසරයක් (Business Enabling Environment) නිර්මාණය කිරීම සඳහා රජය විසින් සාධනීය රැසක් ගෙන ඇත.

ව්‍යාපාරයක් ආරම්භ කිරීම, ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සහ ව්‍යාපාරයක් පුළුල් කිරීම යන සෑම අදියරකදීම අදාළ වන අනිවාර්ය සේවා සම්බන්ධයෙන් කටයුතු කරන විවිධ ව්‍යාපාරික පහසුකම් සපයන රාජ්‍ය ආයතන 54 කින් සමන්විත කාර්ය සාධක බලකා කමිටු අටකට ගොනු කර ප්‍රමුඛතා පදනමින් ආයතනික පද්ධති සංවර්ධන/ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා අදාළ ක්‍රියාකාරී සැලසුම් සකස් කර ඇත.

- **ව්‍යාපාරයක් ආරම්භ කිරීම;** සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවාවන් සැපයීම් කඩිනම් කිරීමට අදාළ අනෙකුත් ආයතන හා සම්බන්ධ කිරීමට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම. විද්‍යුත් සමාගම් ලියාපදිංචි කිරීමේ පද්ධතියෙහි( e-ROC) කාර්යක්ෂමතාව තව දුරටත් ඉහළ නංවාලීමට ඩිජිටල් අත්සන් යෙදීමේ පද්ධතිය වැඩි දියුණු කරමින් පවතී.
- **ඉදිකිරීම් සහතික නිකුත් කිරීම;** දැනට නාගරික සංවර්ධන අධිකාරිය (UDA) මඟින් ස්ථාපිත කර ඇති One Stop Unit හරහා ඉදිකිරීම් සහතික ලබා දීම වේගවත් කිරීමත් එතුළින් ඉදිකිරීම් සහතික නිකුත් කිරීමට අදාළ අනෙකුත් ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමත් කඩිනම් කිරීම. ඉදිකිරීම් සහතික නිකුත් කිරීමට අදාළ අනෙකුත් ආයතන සඳහා One Stop Unit පහසුකම ලබා දීමට සාකච්ඡා කිරීම.
- **දේපළ ලියාපදිංචි කිරීම;** බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා කොළඹ මහ නගර සභාව විසින් යෝජනා කර ඇති තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා රු.මි.106 ක් වෙන් කර දීමට කටයුතු කිරීම.
- **දේශසීමාව හරහා වෙළඳාම් කිරීම;** ජාතික වෙළඳ පහසුකරණ කමිටුව ( NTFC) විධිමත් අධීක්ෂණ අමාත්‍යාංශයක් යටතේ ස්ථාපිත කිරීමට කටයුතු සැලසුම් කිරීම සහ දේශ සීමා හරහා වෙළඳාම් කිරීම පහසු කිරීමේ ඉලක්ක නැවත ප්‍රමුඛතාගත කිරීමට අවශ්‍ය මූලික පියවර ගැනීම.
- **ණය පහසුකම් සැපයීම;** ණය පහසුකම් සැපයීම වේගවත් කිරීමට අදාළ නීති සම්පාදනය කඩිනම් කිරීම.
- **බංකොලොත්භාවයෙන් මිදීම;** ශ්‍රී ලංකා නීති කොමිසම විසින් පත් කළ අනු කමිටුවක් සහ ලෝක බැංකු සහයෝගය මත දැනට නව නීතියක් (Bankruptcy Law) කෙටුම්පත් කර අවසන් කර ඇත.
- **ගිවිසුම් බලාත්මක කිරීම;** වාණිජ නඩු විසඳීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට නව වාණිජ අධිකරණයක් ගොඩනැගීම සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට රු.මි. 30 ක පමණ ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කිරීම.

2022-2024 කාලය තුළ දී ක්‍රියාකාරී සැලසුම් අදාළ ආයතන විසින් නිශ්චිත කාල රාමු තුළ ඉටු කිරීම පිළිබඳව ජනාධිපති කාර්යාලය යටතේ මෙම කාර්ය සාධන බලකා විසින් සමීපව අධීක්ෂණය කරනු ලබයි.

- **ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ**
  - සේවා යෝජක-සේවක කොටස් සහ ආර්ථිකය යන දෙඅංශයටම ප්‍රතිලාභ සැලසෙන පරිදි නව, යාවත්කාලීන සහ ඒකාබද්ධ කම්කරු නීතියක් බලාත්මක කිරීම සඳහා අදාළ දළ කෙටුම්පත සකස් කර ඇත.
  - **නව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හඳුන්වා දීම;**

    අධ්‍යාපන ක්‍රමයේ අවශ්‍ය පරිවර්තනයන් හඳුනා ගෙන ඒ සඳහා කෙටි, මධ්‍ය හා දිගුකාලීන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීමට හැකිවන පරිදි ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සැකසීම සඳහා ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යවරුන් 10 කින් සමන්විත අමාත්‍ය මණ්ඩල කමිටුවක් පිහිටුවන ලද අතර එයට සහය වීම පිණිස පත් කළ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි රාජ්‍ය, පුද්ගලික සහ රාජ්‍ය නොවන සියලු අංශවල ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් විශේෂඥ කමිටුවක් මගින් ශ්‍රී ලංකාව සඳහා නව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවක් සම්පාදනය කර 2023 ඔක්තෝබර් මස අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදුව ඒ සඳහා අනුමැතිය ලැබී ඇත. මෙම නව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව පාර්ලිමේන්තුවේ අධ්‍යාපනය පිලිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.
  - **නිපුණතා අංශයේ ආයතන සහ වෘත්තීය සුදුසුකම් රාමුව ප්‍රතිනිර්මාණය කිරීම;**

    යෝජිත නව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවට අනුගත වන පරිදි රට තුළ වෘත්තීය නිපුණතා සහ පුහුණු ආකෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ නිර්දේශ කිරීම පෞද්ගලික අංශයේ සහ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් යුත් විශේෂඥ කමිටුවක් විසින් සිදු කරනු ඇත.

- **වෙළඳ ලිබරල්කරණය සහ වෙළඳපල ප්‍රවේශය වැඩි දියුණු කිරීම**

දේශීය ආර්ථිකය පුනර්ජීවනය කිරීමේ රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනේ වැදගත් අංගයක් ලෙස අපනයනය ඉලක්ක කරගත් සෘජු විදේශ ආයෝජන වැඩි දියුණු කිරීම සඳහා කලාපීය සහ ගෝලීය සැපයුම් දාමයන් වෙත ප්‍රවේශ වීම සහ ගෝලීය ආර්ථිකය සමඟ නැවත සම්බන්ධ වීම රජය විසින් ඉලක්ක කර සිටී. එහි දී,

- **පවතින අන්තර්ජාතික වෙළෙඳ බාධක අඩු කිරීම;** වසර 3ක් ඇතුළත ආනයන CESS බදු ඉවත් කිරීම සහ වරාය හා ගුවන් තොටුපොල බද්ද (PAL) 2023 සිට වසර 5ක් ඇතුළත ඉවත් කිරීම. මෙහි පළමු අදියර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත, 1979 අංක 40 දරන නියෝග අංක 2325/06 2023.03.28 දිනැති ගැසට් පත්‍රය සහ 2023.04.03 දිනැති අංක 2326/02 දරන PAL ගැසට් පත්‍රය මඟින් ක්‍රියාත්මක කර ඇත.

- **වෙළඳාම් පහසුකරණය**
  - ප්‍රමුඛතා වෙළඳ පහසුකරණ සංරචක ක්‍රියාත්මක කිරීමේදී මාස තුනකට (03) වරක් ජාතික වෙළඳ පහසුකරණ කමිටුවේ (NTFC) කාර්ය සාධනය දැඩි ලෙස සමාලෝචනය කිරීම. කඩිනම් ක්‍රියාවට නැංවීම සඳහා වෙළඳ පහසුකම් ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් නැවත ප්‍රමුඛතා කිරීම.
  - මධ්‍ය කාලීනව ජාතික තනි කවුළුව (NSW) පිහිටුවීම; ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු වලදී දේශසීමා වෙළෙඳ ප්‍රවාහයන් මත ලේඛන සහ දත්ත අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියාත්මක බහු වේදිකා තනි පිවිසුම් ස්ථානයකට ගෙන එනු ඇත.

- **ජාත්‍යන්තර වෙළෙඳාම**

රජය අපනයන ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් විශාල සහ නැඟී එන ආර්ථිකයන් ඉලක්ක කර පුළුල් නිදහස් වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සඳහා ජාතික වෙළඳ සාකච්ඡා කමිටුවක් පිහිටුවීමට රජය පියවර ගෙන ඇති අතර මෙම කමිටුවේ මේ වන විට ඉන්දියාව, චීනය, ඇමෙරිකාව, සිංගප්පූරුව, බංගලාදේශය හා තායිලන්තය යන වෙළෙඳපොළවල් සඳහා උපායමාර්ගික වැදගත්කමක් ඇති නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා පැවැත්වීම සිදු කෙරේ. ජනාධිපති කාර්යාලයේ මඟ පෙන්වීම සහිතව වෙළෙඳ අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යනාදී ආයතන නියෝජනයෙන් මෙම කටයුතු සිදුවන අතර ඊට සමගාමීව විවිධ වෙළෙඳ/ කර්මාන්ත මණ්ඩල හා සංවිධාන ඇතුළු පාර්ශවකරුවන් දැනුවත් කිරීමද සිදු කෙරේ.

- **ජාත්‍යන්තර වෙළෙඳ කාර්යාලය (OIT) ;**

ජාත්‍යන්තර වෙළෙඳ කාර්යාලය සඳහා නීතිමය රාමුව ස්ථාපිත කිරීම (OIT) සඳහා අත්‍යවශ්‍ය මූලික කටයුතු සිදු කර අවසන් කර ඇති අතර ජාත්‍යන්තර වෙළඳ කාර්යාලයේ ප්‍රධාන සාකච්ඡාකරු ඇතුළුව නිලධාරීන් 06 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක්ද පත් කර ඇත. තවද, වෙළෙඳ ගිවිසුම් සඳහා සාකච්ඡා පැවැත්වීමට 2022.10.17 දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක 22/1664/601/020 අනුව ජාතික වෙළෙඳ සාකච්ඡා කමිටුව (NTNC) ප්‍රතිස්ථාපනය කර අනුකමිටු 10 ක් පිහිට වූ අතර එම සාකච්ඡා කමිටුවලට විවිධ රාජ්‍ය ආයතන නියෝජනය කරමින් කාර්ය මණ්ඩලය පත්කර ඇත.

ඒ අනුව, එම කමිටු සම්බන්ධ වෙමින් 2023 වර්ෂයේදී, **පහත පරිදි** සාකච්ඡා සැසි පවත්වන ලදී.

- භාණ්ඩ වෙළෙඳාම පිළිබඳ අනු කමිටුව: තායිලන්තය සහ බංගලාදේශය සමග 09
- සේවා වෙළෙඳාම පිළිබඳ අනු කමිටුව : තායිලන්තය සමග 03
- ආයෝජන පිළිබඳ අනු කමිටුව : 09
- සම්භවය පිළිබඳ නීති පිළිබඳ අනු කමිටුව: 05
- සනීපාරක්ෂාව සහ ශාක සනීපාරක්ෂාව පිළිබඳ අනු කමිටුව : 04
- වෙළෙඳාම ඇති තාක්ෂණික බාධක පිළිබඳ අනු කමිටුව: 03
- රේගු ක්‍රියාපටිපාටි සහ වෙළෙඳ පහසුකම් පිළිබඳ අනු කමිටුව: 01
- වෙළෙඳ ප්‍රතිකර්ම පිළිබඳ අනු කමිටුව: 07
- ආර්ථික සහයෝගීතාව පිළිබඳ අනු කමිටුව : 01

ඉහත අනු කමිටුවලට අමතරව විවිධ පාර්ශවකරුවන් සම්බන්ධීකරණය සහ සාකච්ඡා සඳහා පහසුකම් සපයා ඇත.

- **වෙළෙඳ ගිවිසුම්**

සැකසෙමින් පවතින (on-going) නිදහස් වෙළෙඳ ගිවිසුම්වල සාකච්ඡා සම්බන්ධීකරණය හා අත්සන් කිරීම සම්බන්ධීකරණය (CSLFTA, SLTFTA, ETCA). මෙම සාකච්ඡා වට ජාත්‍යන්තර වෙළෙඳ කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන් සිදු කරන ලදී.

- **තායිලන්ත - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (SLTFTA);** 2023 ජනවාරි මස සිට ජුනි දක්වා සාකච්ඡා වට 5ක් කර ඇති අතර 2024 පෙබරවාරි මස 03 දින තායිලන්ත අග්‍රාමාත්‍යතුමාගේ සහභාගිත්වයෙන් ගිවිසුම අත්සන් කරන ලදී.
- **ඉන්දියාව සමග ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම (ETCA) සම්බන්ධ සාකච්ඡා වට පැවැත්වීම;** මෙම ගිවිසුමෙහි 12 වන වටයේ සාකච්ඡා ඔක්තෝබර් මස 30 දින සිට නොවැම්බර් 01 දින දක්වා පවත්වන ලදී.
- **චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (CSLFTA);** නැවත සාකච්ඡා ආරම්භ කිරීමට ශ්‍රී ලංකා පාර්ශවයේ කැමැත්ත පළකර ලිඛිතව දැනුම් දී ඇති අතර මූලික කටයුතු ආරම්භ කර ඇත.
- **බංගලාදේශ - ශ්‍රී ලංකා වරණීය නිදහස් වෙළෙඳ ගිවිසුම (PTA - Bangladesh);** නැවත සාකච්ඡා ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2023.02.27 දින ලැබී ඇත. 2023.05.29 දින භාණ්ඩ වෙළඳාම සහ සේවා වෙළඳාම පිළිබඳ අනුකමිටු සමග 4 වන වටයේ සාකච්ඡා අතථ්‍ය මාධ්‍ය ඔස්සේ පැවැත්වූ අතර 2023.09.20 දින තාක්ෂණික කමිටු රැස්වීමක් පවත්වන ලදී. ඒ අනුව ඉල්ලීම් ලයිස්තුව පිළියෙල කර සැප්තැම්බර් මස 27 දින බංගලාදේශය වෙත යොමු කර ඇත.
- **ඉන්දුනීසියා - ශ්‍රී ලංකා වරණීය නිදහස් වෙළෙඳ ගිවිසුම (PTA - Indonesia);** 2023.08.29 දින ඉන්දුනීසියා ශ්‍රී ලංකා වරණීය නිදහස් වෙළෙඳ ගිවිසුම සම්බන්ධ සාකච්ඡාවක් අතථ්‍ය මාධ්‍ය ඔස්සේ පැවැත්වුණි. ශ්‍රී ලංකාව හා ඉන්දුනීසියාව අතර අත්සන් කිරීමට නියමිත ඒකාබද්ධ අවබෝධතා ප්‍රකාශය (Joint Statement) අත්සන් කිරීමට සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
- **ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA);** ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධ සාකච්ඡා වට පැවැත්වීමට වෙළෙඳ අමාත්‍යාංශය සහ වාණිජ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය. නිදහස් වෙළඳ ගිවිසුම නැවත සක්‍රීය කිරීමට අදාළව 2023 මැයි මස 29 වන දින අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත.
- **කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වය (RCEP);** කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වය (RCEP) හා සම්බන්ධවීම සඳහා පූර්ව කටයුතු සකසා ගැනීම පිණිස 2023 ජුනි 12 සහ 13 යන දෙදින ජකර්තාහි දි ආසියාන් (ASEAN) සංවිධානයෙහි සභාපති සමඟ ශ්‍රී ලංකා නියෝජිත හමුවක් පවත්වන ලදී. RCEP සමාජිකත්වය ලබා ගැනීමේ අභිප්‍රාය ප්‍රකාශ කිරීමේ ලිපිය (Letter of Intent) ASEAN සභාපති වෙත 2023.06.28 දින යොමු කර ඇති අතර RCEP සමාජිකත්වය ලබාගැනීමට ශ්‍රී ලංකාවේ ඇති සූදානම සහ උනන්දුව පිළිබඳව RCEP සමාජිකත්වය ලබා ඇති රටවල් අතරින් ශ්‍රී ලංකාවේ තනාපති කාර්යාල/මහ කොමසාරිස් කාර්යාල පිහිටුවා ඇති ඉන්දුනීසියාව, තායිලන්තය, ඔස්ට්‍රේලියාව, ජපානය, නවසීලන්තය,වියට්නාමය, මියන්මාරය, මැලේසියාව, චීනය සහ දකුණු කොරියාව යන රටවල නිලධාරීන් සමග ජූලි සහ අගෝස්තු මාසයන්හිදී රැස්වීම් පවත්වා ඇත. එමෙන්ම කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වය (RCEP) ගිවිසුමෙහි අන්තර්ගත පරිච්ඡේද 20 සම්බන්ධව අධ්‍යයනය කිරීම සඳහා භාණ්ඩ වෙළෙඳාම, බුද්ධිමය දේපළ, ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාවය, නීති කටයුතු, රාජ්‍ය ප්‍රසම්පාදන සහ සේවා හා ආයෝජන ලෙස කණ්ඩායම් 06 ක් ස්ථාපිත කර ඒ සම්බන්ධ රැස්වීම් පවත්වා ඇත.

- ❖ **ශ්‍රී ලංකා - ඇමරිකා වෙළෙඳ සහ ආයෝජන රාමු ගිවිසුම(TIFA);** 2023 සැප්තැම්බර් 18 වන දින ශ්‍රී ලංකාව සහ ඇමරිකා එක්සත් ජනපදය අතර වෙළඳ හා ආයෝජන රාමු ගිවිසුමෙහි (TIFA) 14 වන කවුන්සිල හමුව ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපතිනිය ඇතුළු දූත පිරිසකගේ සහභාගිත්වයෙන් කොළඹදී පවත්වන ලදී. මෙහිදී ශ්‍රී ලංකා පාර්ශවයෙන් කෘෂිකර්මාන්තය, ධාරිතාව ගොඩනැගීම සහ තාක්ෂණික සහාය, වෙළෙඳපල ප්‍රවේශය සහ වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක හා ඩිජිටල් ආර්ථිකය යන ප්‍රධාන ශීර්ෂ ඔස්සේ යෝජනා/ගැටලු ඉදිරිපත් කරන ලද අතර ඇමරිකානු පාර්ශවයෙන් ආයෝජන ප්‍රතිපත්ති, කෘෂිකර්මාන්තය, රේගු සහ වෙළෙඳ පහසුකම්, බුද්ධිමය දේපල සහ ව්‍යාපාර කිරීමේ පහසුව යන ප්‍රධාන ශීර්ෂ ඔස්සේ යෝජනා/ගැටලු ඉදිරිපත් කරන ලදී.

- ➢ **ජාතික වලදායිතා කොමිෂන් සභාව**

ජාතික වලදායිතා කොමිෂන් සභාවක් පිහිටුවීමට 2023.08.14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඒ සඳහා අනුමැතිය ලද අතර, ඒ අනුව, අවශ්‍ය මූලික කෙටුම්පත හා එහි විෂය පථය සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ලබාදීමට විශේෂඥ කමිටුවක් පත්කරන ලදී. ඒ අනුව ජාතික වලදායිතා කොමිෂන් සභා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අනුමැතිය අපේක්ෂා කරමින් එම කෙටුම්පත සහ ගරු නීතිපතිතුමාගෙන් ලබා ගන්නා ලද ව්‍යවස්ථාපිත සහතිකය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම යන කරුණු සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර කොමිෂන් සභාව පිහිටුවීමට අදාළ නීති කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට සහ අවසාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

වලදායිතා කොමිෂන් සභා පනත නීතිගත කිරීම හා මූලික කාර්ය මණ්ඩලයක් පත් කර යෝජිත කොමිෂන් සභාව පිහිටුවීම 2024 වර්ෂයේ දී සිදු කෙරෙනු ඇත. 2024 අයවැය යෝජනා මගින් මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

### 2.1.1.4 සියලු ජන කණ්ඩායම්වල සමාජමය අන්තර්ගතභාවය (Social Inclusiveness) සහතික කිරීම

- **විවිධ කණ්ඩායම් අතර සම්මුතීන් ගොඩනැගීම**

  – පාර්ලිමේන්තුව තුළ ජාතික සභාව පිහිටුවීම

  ඒ ඒ දේශපාලන පක්ෂවලින් පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත ජාතික සභාව නමින් පාර්ලිමේන්තු කාරක සභාව පිහිටුවීම 2022.09.20 දින පාර්ලිමේන්තුවේ දී සම්මත විය. මෙමගින් කෙටි, මධ්‍යකාලීන හා දිගුකාලීන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා මඟ පෙන්වීම සහ ආර්ථික ස්ථායීකරණය අරභයා ක්‍රියාත්මක වන වැඩසටහන්වල දී සහාය දීම සිදු කරන අතර ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සහ කෙටි, මධ්‍යම සහ දීර්ඝ කාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ප්‍රමුඛතා හඳුනා ගැනීම සඳහා අනු කාරක සභා දෙකක් පිහිටුවා ඇත. ජාතික සභාවේ පාර්ලිමේන්තු අනුකමිටුව විසින් තීරණය කර පරිදි ජනාධිපති ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් විසින් ජාතික ප්‍රතිපත්ති කොමිෂන් සභාවක් පිහිටුවීම පිළිබඳ කෙටුම්පත් කමිටු වාර්තාවක් සකස් කර සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කර ඇත.

  – යොවුන් පාර්ලිමේන්තු පනත හඳුන්වාදීම

  ජාතික යොවුන් පාර්ලිමේන්තු පනත කෙටුම්පත කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. අමාත්‍යාංශ මට්ටමින් කමිටුවක් පත් කර ඇති අතර කැබිනට් මණ්ඩලයේ ඉදිරිපත් කළ සංශෝධන ඇතුළත් කළ නව කෙටුම්පත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය.

- **සමාජ සවිබල ගැන්වීම, වගකීම හා වගවීම සහ සමාජ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම**

නව සුභසාධන ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ සුභසාධන ප්‍රතිලාභ ගෙවීම සඳහා අඩු ආදායම්ලාභී පවුල් හඳුනා ගැනීම සඳහා නව සුදුසුකම් නිර්ණායක යෙදීම.

ප්‍රතිලාභීන් සඳහා යෝජිත සුභසාධන ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය සඳහා 2023.04.17 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර එය 2023.04.21 දිනැති අංක 2328/13 ගැසට් නිවේදනයේ ද ප්‍රකාශයට පත් කර ඇත. මෙම කාර්යය නිම කිරීමත් සමඟ සුභසාධන වැඩසටහන් වඩා හොඳින් ඉලක්ක කර ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම් (විද්‍යුත් පද්ධති භාවිතයෙන්) වෙත මුදල් මාරු කිරීම් සෘජුවම සිදු කෙරේ. සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය මගින් මෙම කාර්යය සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් සිටී.

– අස්වැසුම සමාජ සුබසාධන වැඩසටහන; අස්වැසුම සමාජ සුබසාධන ප්‍රතිලාභ වැඩසටහනෙහි ගෙවීම් ක්‍රමෝපායන් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල එකඟතාවය 2023.07.31 ලබා දී ඇති අතර මෙමගින් මිලියන 18කට ආසන්න' ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් ආවරණය වේ.

– දිවයින පුරා සිටින අඩු ආදායම්ලාභී පවුල් මිලියන 28.5ක් සඳහා සහල් බෙදාදීමේ වැඩසටහන යටතේ මසකට කි.ග්‍රෑම් 10 බැගින් මාස 02ක් තුල සහල් ලබාදීම සිදු කරන ලදී.

– ජනතා ගැටළු සෘජුවම ජනාදිපති කාර්යාලයට යොමු කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ ක්ෂණික දුරකථන අංකයක් ස්ථාපිත කර මහජනතාව වෙත හඳුන්වා දි ඇත.

- රුපියල් මිලියන 250 අයවැය ප්‍රතිපාදන යටතේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) හරහා ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තරුණ කාන්තා ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කළ අතර නියමු ව්‍යාපෘතියක් ලෙස රු. මිලියන 50ක් තෝරාගත් තරුණ කාන්තා ව්‍යවසායකයින් 200ක් අතරේ බෙදා දීමට කටයුතු සිදු කර ඇත.
- පාසල් ළමුන්ට දිවා අහාර ලබාදීමේ වැඩසටහන යටතේ 2023 වර්ෂයේදී ප්‍රතිපාදන ප්‍රමාණය රු. බිලියන 4 සිට 16 දක්වා වැඩි කර ඇත.

- **විශේෂ අවශ්‍යතා සහිත ජන කණ්ඩායම් බල ගැන්වීම**

විශේෂ අවශ්‍යතා සහිත ජන කණ්ඩායම් බල ගැන්වීමේ අරමුණු කර ගනිමින් පහත ක්‍රියාමාර්ග රජය විසින් ක්‍රියාවට නංවා ඇත.

**ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනත;** ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුකූලව සුදුසු පනත් කෙටුම්පතක් කෙටුම්පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර හඳුනාගත් අඩුපාඩුකම් ද එමඟින් ආවරණය වනු ඇත.

- **සත්‍ය ගවේෂණය සහ සංහිඳියා යාන්ත්‍රණයෙහි පනත් කෙටුම්පත අමාත්‍යමණ්ඩලය වෙත යොමු කර රජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති අතර අන්තර්වාර ලේකම් කාර්යාලයක් පිහිටුවා කාර්යමණ්ඩලය පත් කැඅ ඇත.**

- **ආහාර සුරක්ෂිතතාවය**

ආහාර සුරක්ෂිතතාවය පිලිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය අධීක්ෂණය යටතේ;

පන්සල් ඇතුළු අනෙකුත් ආගමික ස්ථානවල ආහාර හුවමාරු මධ්‍යස්ථාන වලදී ප්‍රදේශයේ නිෂ්පාදිත අතිරික්ත ආහාර ද්‍රව්‍ය හුවමාරු කර ගැනීමට අවකාශය සැලසීම.

ගෘහස්ථ දත්ත (කුටුම්භ මි. 1.7) එක් රැස් කර “Food Gate” පරිගණක යෙදවුම වෙත උඩුගත කර ඇත. ජාතික ආහාර සුරක්ෂිතතා හා පෝෂණ ඒකකය මගින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ අතර ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී යටතේ ස්ථාපිත තර ඇති හරිත කෘෂිකර්ම ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ සහයද මේ සඳහා ලැබී ඇත.

- **උතුරු පළාත් සම්බන්ධීකරණය**

**උතුරු පළාත් සම්බන්ධීකරණ ඒකකය (NPD);** දීර්ඝ කාලීන ගැටුම් හේතුවෙන් උතුරු පළාතේ පදිංචිව සිටින ජනතාවට ඇතිවී තිබෙන ප්‍රධාන ගැටලු හඳුනාගැනීම හා විසඳුම් ලබාදීම අරමුණු කර ගනිමින් ජනාධිපති කාර්යාලයේ විශේෂ ඒකකයක් ස්ථාපිත කරන ලදී. මෙම කාර්යාලයේ විශේෂ උප කාර්යාලයක් උතුරු පළාතේ වවුනියාව දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති අතර එම ඒකකය සක්‍රිය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ප්‍රතිසන්ධානය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවක් ගරු ජනාධිපතිතුමන්ගේ සභාපතිත්වයෙන් යුතුව පිහිටුවා ඇත. අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ කටයුතු සම්බන්ධීකරණය කිරීම මගින් උතුරු පළාතේ ජනතාව මුහුණ දෙන ගැටලු විසඳීම මෙම විශේෂ ඒකකයට පැවරී ඇත.

- උතුරු සහ නැගෙනහිර පළාත් සඳහා 21වන සියවසේ සමාජ - ආර්ථික සංවර්ධන අවශ්‍යතා සලක බලමින් නව සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
- ත්‍රිවිධ හමුදාව සතුව ඇති ජනතා අයිතියට පත් කළ යුතු ඉඩම් හඳුනා ගැනීම සහ නිදහස් කිරිමට අදාළ කටයුතු; යාපනය, කිලිනොච්චි හා මුලතිවු දිස්ත්‍රික්කවල මේ වනවිට ඉඩම් නිදහස් කිරීමේ සහ මැනුම් කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී.

– අවතැන් වූවන්ගේ වත්මන් තත්වය හඳුනා ගනිමින් අදාළ පරිදි ඔවුන් ස්ථානගත කිරීමේ කාර්යයන් සිදු කිරීම.

මෙය යටතේ;

- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (Office for Missing Persons); කිලිනොච්චිය, මන්නාරම, යාපනය සහ මුලතිව් යන ප්‍රදේශවල පරීක්ෂණ 384ක් පවත්වා ඇත.
- හානිපූරණය සඳහා වන කාර්යාලය (Office for Reparations); උතුරු නැගෙනහිර යුද ගැටුමෙන් අතුරුදහන් වූ පුද්ගලයින් 1770 ක් සඳහා 2023 සැප්තැම්බර් 30 වන විට රු.මිලියන 770 ක මූල්‍ය සහන ලබා දීම සඳහා කටයුතු යොදා ඇත.
- ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය (Office for National Unity and Reconciliation); පිහිටුවීම.

- **ජනාධිපති අරමුදල**

1978 අංක 7 දරන පනත යටතේ පිහිටුවා ඇති ජනාධිපති අරමුදල දරිද්‍රතාවයට සහන සැලසීම, අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම, ආගම් නවලිම සඳහා දායකත්වය ලබාදීම, ජාතිය වෙනුවෙන් සේවය කර ඇති තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම සහ ජනාධිපතිවරයාගේ සහ පාලක මණ්ඩලයේ මතය අනුව මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කාර්යයන් ඉටු කිරීම අරමුණු කරගෙන ඇත. මේ යටතේ 2023 මුදල් වර්ෂය තුලදී රු.මිලියන 14.29 ක මුදලක් දරිද්‍රතාවය තුරන් කිරීම, සුභසාධක කටයුතු, වෙනත් අධ්‍යාපන කටයුතු සහ ආගමික කටයුතු සඳහා ලබාදී ඇත. එමෙන්ම මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලට රු. මිලියන 1365.01 ක් සහ අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබාදීම සඳහා රු. මිලියන 153.37 ක් ලබාදී ඇත. තවද,වෛද්‍යාධාර ලෙස රු. මිලියන 844.5 ක මුදලක් ලෙස රෝගීන්ට ලබාදීමද සිදුකරන ලදී.

– අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීම
  - 2021(2022) වර්ෂයේ අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව අ.පො.ස. (උ.පෙළ) හැදෑරීමට සුදුසුකම් ලබන අඩු අදායම්ලාභී සිසුන් 3000ක් අධ්‍යාපන කලාප 100ක් අතරින් තෝරාගෙන රු.5000.00 බැගින් උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය ආරම්භ කළ අතර දැනට මාසික වාරික 10ක් සඳහා ගෙවීම් කර ඇත.
  - 2021/ 2022 වර්ෂයේ අ.පො.ස. (උ.පෙළ) විභාගයෙහි එක එක විෂය ධාරා යටතේ දිවයිනේ විශිෂ්ට කුසලතා දැක්වූ සිසුන් 90 ක් වෙනුවෙන් මුදල් ත්‍යාග සහ සහතිකපාත්‍ර ප්‍රදානයට කර ඇත.

– වෛද්‍යාධාර ලබාදීම
  - ජනාධිපති අරමුදල මගින් වයස අවුරුදු 21 ට අඩු දරුවන් සඳහා මෙරටදී සිදු කරන අක්ෂි සැත්කම් සඳහා වැයවන මුදලින් රු. ලක්ෂ 2 ට යටත්ව ගෙවීම් සිදු කිරීම.
  - මෙතෙක් පිළිකා ප්‍රතිකාර සහ ඖෂධ වෙනුවෙන් පමණක් වෙන්කර තිබූ ප්‍රතිපාදන අර්ධ රාජ්‍ය හෝ පුද්ගලික රෝහල්වලදී සිදු කරන සැත්කම් සඳහාද ලබා දීම.

## 2.2 ඉදිරි දැක්ම

- **ජාතික ආර්ථික පරිවර්තන මාර්ග සිතියමකට ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලිය අනුගත කරවීම**

සංවර්ධන පාර්ශ්වකරුවන් ද අදහස් දක්වා ඇති පරිදි ආර්ථික අර්බුදය අරබයා ශ්‍රී ලංකාව මෙතෙක් අත් පත් කරගෙන ඇති ප්‍රගතිය සතුටුදායක මට්ටමක ඇත. එසේ වුව ද මින් ඉදිරියට අවශ්‍ය වන්නේ නිවැරදි ප්‍රතිපත්ති සහ ආයතන මගින් ශක්තිමත් කරන ලද තිරසාර ප්‍රකෘතියක් සහතික කිරීම සහ විශේෂයෙන්, සියල්ලන් අනුගත වන ශක්තිමත් වර්ධන උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීම සහතික කිරීමය.

මෙම ආර්ථික වර්ධන ක්‍රියාවලියේ දී, සම්ප්‍රදායිකව අනුගමනය කළ උපායමාර්ගවලින් බැහැරව, විශේෂයෙන් විවිධාංගීකරණය ආර්ථිකයට උත්තේජනය කරන නව නිෂ්පාදන හැකියාවන්, දැනුම සහ තාක්‍ෂණය ලබා ගැනීම සඳහා විකාශනය වන නව ආර්ථික මාර්ග හඳුනා ගැනීම අවශ්‍ය වේ.

රටෙහි භාවිතා නොකළ විභවයන් ආමන්ත්‍රණය කිරීමෙන් ආර්ථික කාර්ය සාධන වර්ධනය වැඩි කිරීමටත්, එමඟින් ගුණාත්මක රැකියා වැඩි ප්‍රමාණයක් නිර්මාණය කිරීමටත්, රට නැවත තිරසාර වර්ධන මාවතකට ගෙන ඒමටත් හැකි වන බව රජයේ විශ්වාසයයි. එමෙන්ම අඛණ්ඩ ආර්ථික හා ආයතනික ප්‍රතිසංස්කරණ හරහා තරඟකාරීත්වය වර්ධනය කිරීමටත් සේවා සැපයීම වැඩිදියුණු කිරීමත් රජයේ ප්‍රමුඛ ඉලක්කයකි.

මේ සඳහා කාලයෙන් කාලයට වෙනස් නොවන නිශ්චිත ක්‍රමවේදයකට ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලිය අනුගත කරවීම සඳහා වඩා හොඳ ආර්ථික යහපාලනයක් සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කෙරෙනු ඇත.

- **ජාතික ආර්ථික පරිවර්තන මාර්ග සිතියමක අවශ්‍යතාව**

රජය විසින් ඉදිරි 2048 වන විට ශ්‍රී ලංකාව සමෘද්ධිමත් ජාතියක් ලෙස පූර්ණ සංවර්ධනයක් ලඟා කර ගැනීම සහතික කිරීම රජයේ අරමුණයි. ශ්‍රී ලංකාව පූර්ණ සංවර්ධිත රාජ්‍යයක් බවට පත්කිරීමේ දී ඉදිරි වසර 25ක කාලය තුළ රටෙහි පෙර පැවති ආකාරයේ ආර්ථික අර්බුදකාරී තත්ත්වයකට පත්වීම වැළැක්වීම රජයේ අරමුණු කර සිටී.

මේ සඳහා, රට තුළ නැවත ආර්ථික අවපාතයක් ඇති වීම වළක්වාලීමටත් දීර්ඝ කාලීනව සාර්ව ආර්ථික අරමුණු හා සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීම සඳහා පවතින රජයන්හි අඛණ්ඩ දායකත්වය, නොවෙනස් වන වගකීම හා වගවීම සහ ආර්ථිකයේ ප්‍රධාන පරිවර්තනයන් සිදු කිරීම සහතික වීම පිණිස එම ක්‍රියාවලිය නෛතික රාමුවක් තුළට ගෙන ඒමට කටයුතු කෙරේ. එම ශක්තිමත් නීතිමය රාමුව තුළ අමාත්‍ය මණ්ඩලයේ බලතල සහ වගකීම් ක්‍රියාත්මක කිරීමේ දී පාර්ලිමේන්තුව විසින් අධීක්ෂණ පාලනය ක්‍රියාත්මක කරන යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීමට රජය අපේක්ෂා කරයි. වැරදි දේශපාලන තීරණ හේතුවෙන් අනාගතයේ රට තුළ පුළුල් ආර්ථික පසුබෑමකට තුඩු දෙන වාතාවරණයක් නැවත ඇති වීම වැළැක්වීම මෙහි ප්‍රමුඛ අරමුණයි.

මෙහි දී ආණ්ඩුව විසින්,

- ගෝලීය වශයෙන් අඛණ්ඩව සිදු වන තාක්ෂණයේ වැඩිදියුණුවීම්, වෙනස්වන ජනවිකාශනයන් සහ නැගී එන පාරිසරික අභියෝග හේතු කොට ගෙන ගෝලීය ආර්ථික වටපිටාව තුළ කඩිනමින් සිදුවන වෙනස්කම්
- තිරසාර සංවර්ධනය අභිවර්ධනය කිරීම, සශ්‍රිකත්වය වැඩි කිරීම, ඵලදායීතාවය නැංවීම, සමාජ ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීම සහ සියලු පුරවැසියන්ට සමාන අවස්ථා සහතික කිරීම සඳහා ආර්ථික පරිවර්තනයේ ඇති වැදගත්කම.

- ආර්ථික වර්ධනය මෙහෙයවීමේ දී රැකියා අවස්ථා නිර්මාණය කිරීමේ දී සහ නවෝත්පාදනය සහ තාක්ෂණික දියුණුව වැඩිදියුණු කිරීමේ දී ආයෝජනවල ඇති තීරණාත්මක කාර්යභාරය.
- දේශීය හා විදේශීය යන දෙවර්ගයේ ම ආයෝජකයන්ට සාධාරණ සහ සමාන ලෙස සැලකීම ප්‍රවර්ධනය කරන විනිවිදභාවයකින් යුතු සම්පූර්ණ සහ රීති මත පදනම් වූ පද්ධතියක් අභිවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව කැප වී සිටින බවට සහතික විය යුතු බව.
- ආර්ථික වර්ධනය, තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථිකයන් ලෝක වෙළඳපොළට ඒකාබද්ධ කිරීමට පහසුකම් සැලසීම සඳහා උත්ප්‍රේරකයක් ලෙස ජාත්‍යන්තර වෙළඳාමෙහි ඇති වැදගත්කම.
- ආයෝජනය, පුළුල් වෙළෙඳ අවස්ථා සහ වෙළෙඳ ගිවිසුම් පිළිබඳ ගිවිසගැනීම් සඳහා හිතකර පරිසරයක් සපයනු ලබන සහ ආර්ථික වර්ධනය පුබුදු කිරීම පිණිස ආනයන අපනයන ක්‍රියාකාරකම්වලට පහසුකම් සලසනු ලබන නීති සම්පාදනය කිරීමේ අනිවාර්ය අවශ්‍යතාව.
- ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා සහ අන්‍යොන්‍ය ප්‍රතිලාභ සඳහා අවස්ථා ලබා දීම සඳහා වූ ජාත්‍යන්තර සහයෝගීතාවය සහ සහයෝගය පිණිස ශ්‍රී ලංකාව කැප වී සිටින බව නැවත තහවුරු කිරීම.

යනාදී ගතිකත්වයන් පිළිබඳව දැඩි අවධානයක් ලබා දීම හා ඒවාට අනුශාංගික ප්‍රමුඛතා හා කර්තව්‍යයන් පිළිබඳව පොදු එකඟතාවයකට එළඹීම අපේක්ෂා කරයි;

- **ආර්ථික පරිවර්තන නීතිය (Economic Transformation Law) හඳුන්වා දීම**

ඉහත සඳහන් කරන ලද කරුණු පදනම් කොට ගෙන ඉදිරි වසර 25 තුළ අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතු ජාතික පරිවර්තන මාර්ග සිතියමකට ප්‍රතිපත්තිමය වශයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වගවීම තහවුරු කිරීම පිණිස ආර්ථික පරිවර්තන නීතියක් (Economic Transformation Law) බලාත්මක කිරීම සිදුවනු ඇත. මෙම අරමුණින් යුතුව සකස් කරන ලද ආර්ථික පරිවර්තන පනත් කෙටුම් පත 2024.05.13 දින දින අමාත්‍ය මණ්ඩලය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස අනුමත කර ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කරන ලදුව 2024.05.21 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

ප්‍රධාන අරමුණු ;

i. ප්‍රමාණවත් ආහාරපාන, ඇඳුම් පැළඳුම් සහ නිවාස ද ජීවන තත්ත්වයෙහි නිරන්තර වර්ධනය ද විවේකය හා සමාජයීය සහ සංස්කෘතික ඉඩ ප්‍රස්තා නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම ද ඇතුළුව ප්‍රමාණවත් ජීවන මට්ටමක් සියලු පුරවැසියන් විසින් තමන්ට සහ තම පවුල්වල සාමාජිකයින්ට අත්කර දීම,
ii. රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් තුළින් සහ එකී ආර්ථික ක්‍රියාකාරකම් රටේ සමාජ අරමුණු හා පොදු අභිවෘද්ධිය අරභයා මෙහෙයවීම සහ සම්බන්ධීකරණය පිණිස යෝග්‍යවන සැලසුම් සහ පාලනය නීතියෙන් නියම කිරීමෙන් මුළු රටේම ශීඝ්‍ර සංවර්ධනයක් ඇති කිරීම සහ
iii. ආර්ථික අර්බුද ඇතිවීම වැලැක්වීම.

මෙමගින්, විචක්ෂණශීලී ආර්ථික තීරණ ගැනීමේ දී තීව්‍ර ලෙස මඟ පෙන්වීමක් සිදු වනු ඇති අතර රජයේ ක්‍රියාමාර්ග මහජනතාවට වගකියන බව සහතික කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය කිරීම සහ තිරසාර ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය සාධක වන ආර්ථික ප්‍රතිපත්තිවල ස්ථාවරත්වය සහ පුරෝකථනය කිරීමේ හැකියාව තවදුරටත් එතුළින් නිර්මාණය වනු ඇත. ආයෝජකයින්ට සහ ව්‍යාපාරිකයන්ට ආර්ථික තීරණ ස්ථාවර සහ විශ්වාසදායක ලෙස ගනු ලබන බව තහවුරු විය යුතුය.

දිගුකාලීන උපාය මාර්ගික ප්‍රවේශයක් සහිතව පාරිසරික, සමාජීය, ආර්ථික සහ විශේෂයෙන් පරම්පරා කිහිපයකට බලපාන විවිධ වූ පැතිකඩ සලකා බැලීම අවශ්‍ය වන ආකාරයේ ඵලදායී ආර්ථික කළමනාකරණයක් ප්‍රවර්ධනය කෙරෙනු ඇත. වත්මන් සහ අනාගත පරම්පරාවේ යහපැවැත්මට ප්‍රමුඛත්වය දෙන තීරණ ගැනීමට රජයන්ට මඟපෙන්වන තිරසාර සංවර්ධනය, පාරිසරික ආරක්ෂාව සහ සමාජ සුබසාධනය ප්‍රමුඛ වන ප්‍රතිපාදන එමඟින් ආවරණය වනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවන්ට පැමිණ ඇති මූලධර්මයන්/කොන්දේසි ආර්ථික පරිවර්තන නීතියට අන්තර්ග්‍රහණය කර ඇත. දීර්ඝ කාලීනව රජය ආර්ථික වශයෙන් සිදු කළ යුතු පරිවර්තනීය ක්‍රියාමාර්ග මෙහෙයවීමට අදහස් කරන ප්‍රතිපත්තිමය රාමුව ඊට ඇතුළත් වේ.

ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිමය මූලධර්ම අනුව ආණ්ඩුව විසින් ගෙවිය යුතු ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කර්තව්‍යයේ දී;

i. දළ දේශීය නිෂ්පාදිතයට රාජ්‍ය ණය අනුපාතය 2032 වර්ෂය වන විට සහ ඉන් පසුව සියයට අනූ පහකට වඩා අඩුවන පරිදි
ii. දළ දේශීය නිෂ්පදිතයට මධ්‍යම ආණ්ඩුවේ වාර්ෂික දළ මුදල් සැපයීමේ අවශ්‍යතා අනුපාතය 2032 වර්ෂය වන විට සහ ඉන් පසුව සියයට දහතුනකට වඩා අඩුවන පරිදි සහ
iii. දළ දේශීය නිෂ්පාදිතයට මධ්‍යම ආණ්ඩුවේ වාර්ෂික ණය ගෙවීමේ අනුපාතය 2027 වර්ෂය වන විට සහ ඉන් පසුව සියයට හතරයි දශම පහකට වඩා අඩුවන පරිදි

කටයුතු කෙරෙනු ඇත.

ඊට අමතරව, ශ්‍රී ලංකාව ඉහළ තරඟකාරීත්වයක් සහිත අපනයනය වෙත යොමු වූ ඩිජිටල් ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම සඳහා;

i. තරඟකාරීත්වය වැඩි කිරීම සඳහා ජාතික ආර්ථික විවිධාංගීකරණය කිරීම සහ දැඩි ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීම.
ii. 2050 වර්ෂය වන විට ශුද්ධ ශුන්‍යයක් (Net Zero) ළඟා කර ගැනීම
iii. ගෝලීය ආර්ථිකය සමඟ ඒකාබද්ධ වීම වර්ධනය කිරීම
iv. ස්ථාවර සාර්ව ආර්ථික තුලනයක් සහ තිරසාර ණය සාක්ෂාත් කර ගැනීම
v. ගොවීන්ගේ ඵලදායීතාවය, ගොවීන්ගේ ආදායම සහ කෘෂිකාර්මික අපනයන ඉහළ නැංවීම සඳහා කෘෂිකර්මය නවීකරණය කිරීම.
vi. පූර්ණ ආර්ථික වර්ධනය සහ සමාජ ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීම සඳහා ආණ්ඩුව කටයුතු කළ යුතු වේ.

තවද, පහත දැක්වෙන ඉලක්ක මත ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පදනම් කර ගැනීමේ වගකීම පවතින අමාත්‍ය මණ්ඩලය වෙත පැවරේ;

i. දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය - 2027 වර්ෂය වන විට වාර්ෂිකව 5%ක් දක්වා ළඟා වීම සහ ඉන් පසුව වාර්ෂිකව 5%කට ඉහළ මට්ටමකට ළඟා වීම.
ii. 2025 වර්ෂයේ සිට විරැකියාව ශ්‍රම බලකායෙන් 5%කට වඩා අඩු මට්ටමකට ළඟා වීම.
iii. කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය 2023 වර්ෂය වන විට 40% නොඅඩු මට්ටමක් වෙත ළඟා වීම සහ 2040 වර්ෂය වන විට 50%කට නොඅඩු මට්ටමක් වෙත ළඟා වීම.
iv. ගෙවුම් ශේෂයෙහි ජංගම ගිණුමේ හිඟය වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදිතයෙන් 1%ක් නොඉක්මවිය යුතු වීම.
v. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස භාණ්ඩ හා සේවා අපනයනය කිරීම. 2025 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් 25%කට නොඅඩු මට්ටමකට ළඟා වීම, 2030 වර්ෂය වන විට 40%කට නොඅඩු මට්ටමකට ළඟා වීම සහ 2040 වර්ෂය වන විට 60%ක මට්ටමක් වෙත ළඟා වීම.

vi. 2032 වර්ෂය දක්වා ආණ්ඩුවේ අයවැයෙහි ප්‍රාථමික ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.3%ක මට්ටමකට සහ 2032 වර්ෂයේ සිට ඉදිරියට එය දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් 2%ක මට්ටමකට ළඟා වීම.

vii. 2027 වර්ෂයෙන් ඉදිරියට ආණ්ඩුවේ ආදායම, දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් 15%ක මට්ටමකට ළඟා වීම සහ

viii. 2027 වර්ෂය වන විට බහු මාන දරිද්‍රතා අනුපාතය 15%කට වඩා අඩු විය යුතු අතර 2035 වර්ෂය වන විට එය 10% වඩා අඩු විය යුතු වීම.

ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීම සඳහා 2025 වර්ෂයෙන් ආරම්භ වී සෑම වසර පහකට වරක් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති රාමුව සහ ක්‍රමෝපායයන් පිළිබඳ වාර්තාවක් පිළියෙළ කර ආර්ථික ප්‍රතිපත්ති විෂය භාර අමාත්‍යවරයා විසින් එම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර පළමු වාර්තාව 2025 වර්ෂයේ දී ඉදිරිපත් කරනු ලැබේ.

- **නව ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කිරීම**

මෙම සමස්ත ක්‍රියාවලිය ඒකාබද්ධ ප්‍රවේශයකින් යුතුව සාක්ෂාත් කර ගැනීම පිණිස ආණ්ඩුවට සහාය වීම අරබයා ප්‍රධාන වශයෙන් පහත සඳහන් ආයතනවල භූමිකාව වැදගත් වනු ඇත;

- ශ්‍රී ලංකා ආර්ථික කොමිෂන් සභාව,
- ශ්‍රී ලංකා ආයෝජන කලාප (Zone Sri Lanka),
- ජාත්‍යන්තර වෙළඳ ආයතනය,
- ජාතික ඵලදායිතා කොමිෂන් සභාව, සහ
- ශ්‍රී ලංකා ආර්ථික හා වෙළඳ ආයතනය

එම ආයතන පිහිටුවීම සඳහා වන විධිවිධාන සහා ඒවායේ කාර්යභාරය ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතට අන්තර්ගත කර ඇත. ආර්ථික පරිවර්තන නීතිය හඳුන්වාදීමත් සමඟ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නීතිය පරිච්ඡින්න වනු ඇති අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙනුවට ශ්‍රී ලංකා ආර්ථික කොමිෂන් සභාව සහ ආයෝජන කලාප (Zone Sri Lanka ආයතනය) ක්‍රියාත්මක වේ.

මෙම නව ආයතනික රාමුව හරහා සිදු කිරීමට අපේක්ෂිත ප්‍රධාන මූලාරම්භයන්;

- ආයෝජනය, ජාත්‍යන්තර වෙළෙඳාම සහ ආයෝජන කලාප පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සහ අමාත්‍ය මණ්ඩලයට ඒ පිළිබඳව නිර්දේශ කිරීම.
- ශක්තිමත් ආයෝජන පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමත් අපනයනය වැඩි කිරීම මගින් ජාත්‍යන්තර වෙළෙඳාම දිරිමත් කරනු ලබන තිරසර සෘජු විදේශ ආයෝජනවලට පහසුකම් සැලසීමත් මගින් ශ්‍රී ලාංකික පුරවැසියන්ට ආදායම් මාර්ග හා මහා පරිමාණයෙන් රැකියා අවස්ථා වැඩි කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය මැදිහත් වීම සිදු කිරීම.
- විශේෂයෙන්, ආයෝජකයන්, ආයෝජන සහ අපනයනකරුවන් සඳහා සිය ව්‍යාපාර කටයුතු කිරීම පහසු කරන වාතාවරණයක් (business enabling environment) නිර්මාණය ප්‍රවර්ධනය කිරීම.
- භාණ්ඩ හා සේවා අපනයනය කිරීම මගින් මෙරට තරුණ තරුණියන්ට හා වෘත්තිකයන්ට ගුණාත්මක රැකියා අවස්ථා ජනනය කළ හැකි සහ ආර්ථිකයේ සමස්ත වර්ධනය සඳහා සැලකිය යුතු ප්‍රතිලාභ අත්කර දෙන උපායමාර්ගික වැදගත්කමකින් යුතු ආයෝජන තීරණය කිරීමත් එවැනි උපායමාර්ගික වැදගත්කමකින් යුතු ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා වන දිරිගැන්වීම් සමාලෝචනය කර ඒ පිළිබඳව අමාත්‍යවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ජාත්‍යන්තර වෙළෙඳාම දිරිමත් කරන ප්‍රතිපත්ති සකස් කර එමගින් විදේශීය විනිමය මූලාශ්‍ර විවිධාංගිකරණය කිරීම සහ අපනයන ආදායම වැඩි කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුළුල් කිරීම සඳහා ඉවහල් වන ප්‍රතිපත්තිමය මූලාරම්භයන් හා මැදිහත්වීම් කැබිනට් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.
- ආයෝජන කලාප ප්‍රකාශයට පත් කිරීමේ දී නිර්දේශ ඉදිරිපත් කිරීම.
- වැඩි අපනයන දිශානතියක් සහිතව ආර්ථික විවිධාංගීකරණයකට සහ තාක්ෂණික දියුණුවට දායක වන ආකාරයෙන් ආර්ථිකයට ප්‍රබල ලෙස දායක වන අංශ සහ උප අංශ වෙත විදේශ ඍජු ආයෝජන වඩාත් ක්‍රියාශීලී සහ ඉලක්කගත ආකාරයෙන් ආකර්ෂණය කර ගැනීම.
- ආයෝජන හා අන්තර්ජාතික වෙළෙඳාම සම්බන්ධයෙන් ආයතන අතර ප්‍රතිපත්තිමය සමෝධානය, උපාය මාර්ගික පෙළගැස්ම සහ සහජීවනය සහතික
- අන්තර්ජාතික වෙළෙඳ සාකච්ඡා ශ්‍රී ලංකාවේ උපාය මාර්ගික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අරමුණු සමඟ ඍජුව පෙළගැස්වීමට බලවත් පෙළඹවීමක් සහතික කිරීම
- වෙළෙඳ-ආයෝජන සම්බන්ධයේ (trade & investment nexus) අපේක්ෂිත ප්‍රතිලාභ වඩාත් ක්‍රියාකාරී ලෙස මෙහෙයවීම
- ආයෝජකයින් සඳහා කාර්මික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම මෙන්ම එවැනි යටිතල පහසුකම්වල වෘත්තීය කළමනාකරණය, මෙහෙයවීම සහ කලාප සංවර්ධනය සඳහා පුද්ගලික ආයෝජකයින්ට අවස්ථා ලබා දීමට අවශ්‍ය නිදහස ලබා දීම
- ආයෝජනය, ජාත්‍යන්තර වෙළෙඳාම සහ අපනයනය සඳහා ඉමහත් ලෙස දායක වන ආයෝජන කලාප විචක්ෂණ ලෙස පිහිටුවීම, මෙහෙයවීම හා කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සඳහා පහසුකම් සැලසීම.
- ආයෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ පසුබිමක් සෑම ආයෝජන කලාපයක් විසින් ම පවත්වාගෙන යනු ලබන බවට සහ එමඟින් රැකියා අවස්ථා වැඩි කරන බවට සහතික වීම.
- රටේ ආර්ථික පදනම ශක්තිමත් කිරීමේ ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම.
- ශ්‍රී ලංකාවට ගෝලීය සැපයුම් දාමයන් සමඟ ඵලදායීව සම්බන්ධ වීමට නම් රටෙහි වෙළඳ කටයුතු පිලිබඳ නීති රීති ලිහිල් කිරීම, අපනයන කේන්ද්‍ර කරගත් ආයෝජන ආකර්ෂණය කර ගැනීම
- නිදහස් වෙළෙඳ ගිවිසුම් හරහා ගෝලීය වෙළෙඳපොළ ප්‍රවේශයන් වර්ධනය කර ගැනීම සහ වෙළෙඳ පහසුකම් වැඩිදියුණු කිරීම
- ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය විසින් වෙළෙඳපොළ පිවිසුම් බාධක ඉවත් කිරීම හෝ අඩු කිරීම සහ ලාංකීය භාණ්ඩවලට හා සේවාවලට ජාත්‍යන්තර වෙළෙඳපොළට ඇතුළු වීමට පහසුකම් සැලසීම මගින් ලාංකීය භාණ්ඩ හා සේවා අපනයනය ඉහළ නැංවීම.
- ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් සහ කලාපීය වෙළෙඳ ගිවිසුම් ඇතුළු ජාත්‍යන්තර වෙළෙඳ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ථාපනය කරන ලද අග්‍රස්ථ ආයතනය ලෙස ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය එම කර්තව්‍යය අදාළ සියලුම ආයතන සහ පාර්ශවකරුවන් සමඟ මනා සම්බන්ධීකරණයෙන් යුක්තව සිදු කිරීම.
- ආර්ථික ස්ථාවරකරණය සඳහා සිදු කරන ප්‍රතිසංස්කරණවලින් ලැබෙන ප්‍රතිලාභ උපරිම කර ගැනීම සඳහා සහ ඒවායේ තිරසාර බව සහතික කිරීම සඳහා ආර්ථිකයේ සියලුම අංශවල ඵලදායිතාව වැඩිදියුණු කිරීම.
- ඵලදායිතාව සම්බන්ධ ගැටළු සොයා බැලීමට ස්ථාපනය කරන ස්වාධීන ආයතනයක් පිහිටුවීම සහ සාක්ෂි සහ දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ එමඟින් රජයට නිර්දේශ කිරීම
- පර්යේෂණ සහ සාක්ෂි මත පදනම්ව ඵලදායිතා ගැටළු විමර්ශනය කිරීමටත් ඵලදායිතාව ඉලක්ක කර ගත් ආර්ථික ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග පිළිබඳව රජයට උපදෙස් දීම.

- ආර්ථික සහ වෙළෙඳ කටයුතු හා ප්‍රතිපත්තීන් පිලිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා නිලධාරීන්ට අධ්‍යාපනයක් ලබා දීම තම විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති නිර්මානයේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී අදාළ පාර්ශ්වවලට නිවරදී දැනුමක් හා ලබා දීම.

එමෙන්ම 2024 අයවැය යෝජනා මගින් ආර්ථික සංවර්ධනය ඉදිරියට ගෙන යාම අරමුණු කරගත් අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණවල ආරම්භක ප්‍රගතිය සනිටුහන් කරයි. අභියෝග සහ අවස්ථානුකූල ප්‍රතිවිරෝධතා මධ්‍යයේ වුවද, යෝජිත ආර්ථික ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්ති, ස්ථාවර ආර්ථිකයක් කරා යන ගමනට ශ්‍රී ලංකාව අවතීර්ණ කිරීමට උපකාරී වනු ඇත.

එමගින්, පහත පරිදි ආර්ථිකයේ ප්‍රධාන සංරචකයන්හි වේගවත් පරිවර්තනිය වෙනසක් සිදුවීම අපේක්ෂා කරනු ලබයි.

- **අධ්‍යාපන ප්‍රතිසංස්කරණ**

ජනාධිපතිතුමාගේ සභාපතිත්වයෙන් යුතු, අග්‍රාමාත්‍යතුමා සහ අධ්‍යාපන අමාත්‍යතුමා ද ඇතුළත් වන පරිදි සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක අධීක්ෂණය යටතේ සාමාජිකයන් 25 දෙනෙකුගෙන් යුතු විද්වත් නිලධාරි කමිටුවක් මගින් රටෙහි අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පරිවර්තනයක් සිදු කිරීම සඳහා පුළුල් සහ දූරදර්ශී මාර්ග සැලැස්මක අවශ්‍යතාව පිළිබඳ යෝජනා ඉදිරිපත් කරමින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2023-2033) සම්පාදනය කරන ලදී. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය, සමානාත්මතාව සහ විශිෂ්ටත්වය කරා එළැඹීමට අවශ්‍ය වන්නා වූ මූලික අරමුණු, ක්‍රමෝපායන් සහ ක්‍රියාමාර්ග මෙම රාමුව තුළින් සැකෙවින් ගෙනහැර දක්වන අතර ජාතික සංවර්ධන අභිමතාර්ථ, අධ්‍යාපනය සම්බන්ධයෙන් පවතින ගෝලීය ඉලක්ක සමඟ අනුගත වන අයුරින් සකස් කර ඇත.

මෙම ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2023-2033) මඟින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තිරසාර පරිවර්තනයක් සඳහා ප්‍රධාන ප්‍රතිපත්තිමය මඟපෙන්වීම් 3 ක් ඉදිරිපත් කර ඇත.

- ඉගෙනුම්, ඉගැන්වීම් සහ සහතිකකරණය සඳහා වන නීතිමය රාමුව නැවත සමාලෝචනය
- පාලනය සඳහා වගකිවයුතු පාර්ශවයන් සහ ආයතන නැවත නිර්වචනය
- ආයෝජන සහ සම්පත් ප්‍රශස්තකරණය

මෙමගින් පහත සඳහන් ප්‍රධාන වෙනස්කම් ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කරයි.

- ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනයට ඇති අවස්ථා පුළුල් කිරීම
- නව වැඩ ලෝකයට ගැලපෙන පරිදි නවීකරණය කල ජාත්‍යන්තර මිණුම් දඬුවලට අනුව ප්‍රමිතිගතවූ ජාතික විෂයමාලා සහ ඇගයීම්
- අවසාන විභාග සඳහා අඩු බරක් සහ ව්‍යාපෘති පාදක ඇගයීම් කෙරෙහි වැඩි අවධානයක්
- සහතික කිරීමේ හා ප්‍රතිලාභ ලබා දීමේ යාන්ත්‍රණයන් සහ ගුරු වැටුප් සංශෝධනයන් හඳුන්වාදීම තුළින් සුදුසුකම් ලත් පුද්ගලයින් ආකර්ෂණය කර ගනු ලබන ගුරු වෘත්තීය පරිවර්තනයක් සිදු කිරීම - ජාතික ගුරු වෘත්තික සභාව පිහිටුවීම.
- අධ්‍යාපනයේ පරිවර්තනයට බාධා කරන ව්‍යුහාත්මක සහ ගුණාත්මක සාධක මග හරවා ගැනීම සඳහා අධ්‍යාපන පරිපාලනය වඩාත් විමධ්‍යගත කිරීම සඳහා පරිපාලන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම.

- නිපුණතා සංවර්ධනය සඳහා වන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) වෙනුවට අධිකාරියක් ලෙස ජාතික නිපුණතා කොමිෂන් සභාව (NSC) ප්‍රතිසංවිධානය කිරීම. මෙහිදී ජාතික නිපුණතා කොමිෂන් සභාව (NSC) මගින්, ජාතික සහ පළාත් මට්ටමින් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවල නිපුණතා අංශය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය, වාර්ෂික ශ්‍රම වෙළෙඳපොළ සිතියම්ගත කිරීම පැවැත්වීම, දැනට පවතින රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු සපයන්නන් විශ්වවිද්‍යාල පද්ධතිය හා සම්බන්ධිත විද්‍යාල පද්ධතියක් ලෙස ඒකාබද්ධ කිරීමට පියවර ගැනීම, නිපුණතා කවුන්සිල පිහිටුවීම සහ ඒවා ස්ථාපිත කර ඇති පරිදි ඒවාට කාර්යයන් පැවරීම සිදු කරනු ඇත.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ජාතික උසස් අධ්‍යාපන කොමිෂන් සභාව (NHEC) මගින් ප්‍රතිස්ථාපනයකෙරෙනු ඇති අතර, එම ආයතනය ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව උසස් අධ්‍යාපනය සම්බන්ධීකරණය කිරීම සහ රාජ්‍ය නොවන හෝ උසස් අධ්‍යාපන ආයතන විසින් නිකුත් කරන ලද සියලුම උපාධි සහ උපාධිවලට සමාන අධ්‍යයන ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ වගකීම දරනු ඇත.
- ජාතික තත්ත්ව සහතික සහ ප්‍රතීතන යාන්ත්‍රණයක් මගින් ස්ථාවර තත්ත්ව ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා ජාතික මට්ටමේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන දෙකෙහිම මුල් ළමාවිය අධ්‍යාපනය, පාසල් අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය සඳහා ඒකාබද්ධ තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනයක් ලබා දෙනු ඇත.
- අධ්‍යාපනයේ සියලුම අංශයන්හි රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ඇතුළුව රාජ්‍ය නොවන හවුල්කරුවන්ගේ සහභාගීත්වයට පහසුකම් සැලසීමට පියවර ගනු ඇත.
- රාජ්‍ය අංශයේ අධ්‍යාපනය සඳහා සිදු කරනු ලබන ආයෝජන වඩාත් තාර්කික ක්‍රමවේදයකට අනුව සිදු කරනු ඇත.
- පර්යේෂණ සංස්කෘතියක් බිහිකිරීම, ඉගැන්වීමේ නවෝත්පාදන, අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය, කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ හවුල්කාරිත්වය සහ ජාත්‍යන්තර සම්බන්ධතා සඳහා තරඟකාරී ප්‍රදාන ලබා දීම සහ/හෝ අධ්‍යාපන ආයතන සඳහා දිරිගැන්වීම් ලබා දීම පිණිස, තරඟකාරී ආධාර ප්‍රදානය කිරීම සහ/හෝ අධ්‍යාපන ආයතන සඳහා දිරිගැන්වීම් නිර්මාණය කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සිදුවනු ඇත.
- උසස් අධ්‍යාපනය සහ කුසලතා සංවර්ධනය සඳහා විදෙස් ආයෝජනවලට ඇති සීමා ක්‍රමයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

- **කෘෂිකර්ම නවීකරණය**

කෘෂිකර්ම නවීකරණ ලේකම් කාර්යාලය මගින් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම අංශය නවීකරණය කිරීම සඳහා සහ පරිවර්තනය කිරීම අරමුණු කරගත් කෘෂි නවීකරණ වැඩසටහන ක්‍රියාත්මක වීම අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි. මෙම වැඩසටහන යටතේ කෘෂි නවීකරණ කේන්ද්‍රස්ථාන (Agriculture Modernization Hub) ප්‍රාදේශීය ලේකම් කොට්ටාස මට්ටමින් ස්ථාපිත කිරීමට නියමිත අතර ප්‍රාදේශීය මට්ටමේදී මූලික අදියර ලෙස දිස්ත්‍රික්ක 25 හි තෝරාගනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ 26ක් තුල නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙන අතර දෙවන අදියරෙහිදී සෑම දිස්ත්‍රික්කයකින්ම ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ 03 බැගින් ප්‍රාදේශීය ලේකම් කොට්ටාස 75 ක කෘෂිකර්ම නවිකරන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

තවද, කෘෂිකර්ම නවීකරණ ජාතික ප්‍රතිපත්ති රාමුව සකස් කර 2024.04.03 දින ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත.

- **රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ**

තෝරාගත් රාජ්‍ය ව්‍යවසාය (08ක්) සඳහා ප්‍රතිසංස්කරණ වැඩසටහන් අරාම්භ කර, එම ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ යටතේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය ස්ථාපනය කර ක්‍රියාත්මක වෙමින් පවතී.මෙහි සමබ්නධිකරණය යටතේ ගුවන් සේවා, දුම්රිය, සන්නිවේදන ඇතුළු ව්‍යවසායයන් සඳහා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීම 2024 වර්ෂයේ සිට ආරම්භ කරනු ඇත.

- **විදුලිබල සහ බලශක්ති අංශයේ ප්‍රතිසංස්කරණ**
  - විදුලිබල ක්ෂේත්‍රයේ විදුලිබල ජනන, සැපයුම් සේවා සහ බෙදාහරීම් අංශවල කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාව ඉහළ නැංවීම අරමුණු කරගත් පුළුල් ප්‍රතිසංස්කරණ සඳහා යෝජිත නව විදුලිබල පනත සම්මත කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.
  - වාර්ෂිකව 5% කින් විදුලි ඉල්ලුම වර්ධනය වන බැවින් මෙම ඉල්ලුමට සරිලන පරිදි ප්‍රමාණවත් ජනන ධාරිතාවක් වර්ධනය කිරීම, තිරසර ජනනයට බාධාවකින් තොරව පුද්ගලික ආයෝජන හරහා සිදු කෙරෙනු ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් විශේෂඥ කමිටුවක් පත් කර ඇති අතර එමගින් නීතිමය සහ ආයතනික ප්‍රතිසංස්කරණ අධ්‍යයනය කර නිර්දේශ කරනු ඇත.
  - ශ්‍රී ලංකාවේ බලශක්ති අවශ්‍යතාවය සුනිත්‍ය බලශක්ති ප්‍රභව වෙත යොමුකිරීමේ වැයමක් ලෙස ග්‍රීන් හයිඩ්‍රජන් යොදාගැනීමේ මාර්ග සිතියමක් සම්පාදනය සහ ශක්‍යතා අධ්‍යයනයෙන් අනතුරුව 2024 හා 2026 කාලසීමාව තුළ නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත්, 2026 වර්ෂයේ සිට ග්‍රීන් හයිඩ්‍රජන් වාණිජමය වශයෙන් යොදාගැනීමටත් නියමිතය.

- **හරිත ආර්ථිකයක්**

එමෙන්ම තිරසර සංවර්ධන වැඩසටහනට අනුකූල වන පරිදි මහා භාණ්ඩාගාරයේ දේශගුණික මූලයකරන ඒකකයක් ඇති කිරීමටත්, ජනාධිපති කාර්ථයාලයේ දේශගුණික විපරයාස සම්බන්ධ කාර්යාලයක් ඇති කිරීම මගින් ශ්‍රී ලංකාවේ දේශගුණික සෞභාග්‍ය සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහාය වන ආයතනික ව්‍යුහය නිර්ථමාණය කිරීමට පියවර ගනිමින් සිටින අතර ජාතයන්තර දේශගුණ විපයාස විශ්ව විද්‍යාලයක් සහ දෙශ ගුණික විපරයාස කොමිසමක්ද ස්ථාපිත කිරීමට නියමිතය.

- **ඩිජිටල්කරණය**
  - වසර 2030 වන විට ඩිජිටල් ආර්ථිකයක අත්පත් කරගැනීම සඳහා තාක්ෂණයට අදාළ සංවිධානාත්මක ව්‍යුහය ප්‍රතිවුහගත කිරීමට අපේක්ෂිත අතර, රාජය අංශය ඩිජිටල්කරණය කිරීම සඳහා අවශය නායකත්වය හා මග පෙන්වීම සැපයීම වෙනුවෙන් පූර්ණ බලතල සහිත ඩිජිටල් අධිකාරියක් පිහිටුවීමට කටයුතු කෙරේ.
  - එමෙන්ම කෘතිම බුද්ධිය පදනම් කරගත්, ආර්ථික හා සමාජයීය පරිවර්තනයක් සිදු කිරීම අරමුණු කරගනිමින් කෘතිම බුද්ධිය පිළිබඳ ජාතික මධ්‍යස්ථානයක් ස්ථාපිත කෙරෙනු ඇත.
  - මීට අමතරව, රාජ්‍ය අංශය, විශේෂඥ ආයතන හා සිවිල් සමාජය සම්බන්ධිකරණයෙන් තාක්‍ෂණික නවෝත්පාදන දිරිගැන්වීම උදෙසා තාක්‍ෂණික නවොත්පාදක සභාවක් පිහිටුවීමටද අපේක්ෂිතය.

- **සැපයුම්**

ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම ප්‍රයෝජනයට ගෙන එය සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කිරීමේ මූලික පියවරක් ලෙස, රජය සියළුම පාර්ශවකරුවන් සමඟ එකතු වී ජාතික සැපයුම් ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ගොඩබිම් සබඳතා ඇතිකරගැනීම, කොළඹ දකුණ වරාය මගින් නිරිතදිග ඉන්දියාවේ සැපයුම් අවශ්‍යතා සපුරාලීම සහ ත්‍රිකුණාමලය වරාය මගින් අග්නිදිග ඉන්දියාවේ සැපයුම් අවශ්‍යතා සපුරාලීම මෙහි අරමුණු අතර වේ. ඉදිරියේදී නිමකිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන් මගින් කොළඹ වරායේ බටහිර පර්යන්තය හා 2030 වසරෙන් පසු කොළඹ උතුර වරාය නිර්මාණය වීමෙන් පසු කොලඹ වරායේ ධාරිතාවය තවදුරටත් වැඩිදියුණු වනු ඇත.

- **ධීවර අංශය**

ධිවර අංශයේ ඵලදායිතාව ඉහල නැංවීම සහ ඉහළ මට්ටමේ ධිවර කර්මාන්තය ප්‍රවර්ධනය පදනම් කරගත් උපායමාර්ගික සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂඥ කමිටුවක් මගින් කටයුතු කරමින් පවතී.

- **සංචාරක**

වර්ෂයකදී අවම වශයෙන් මිලියන 5 ක සංචාරක ආකර්ශනයක් ලබාගැනීම සඳහා සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය පිණිස නව ස්වරූපයේ දිර්ඝකාලින වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ජාතික මට්ටමේ සහ සහ උප ජාතික මට්ටමේ ආයතන 2024 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

- **සියලු ජන කණ්ඩායම්වල සහජීවනය සහ සමාජීය අන්තර්ගතභාවය සහතික වූ සමාජයක්**
  - **"උරුමය" වැඩසටහන**

    මුඩුබිම් පනත (1897) යටතේ ඉඩම් අයිතිය අහිමි වූ ගොවි ජනතාවට නැවත එම ඉඩම් වල පූර්ණ අයිතිය ලබාදීම සඳහා "උරුමය" වැඩසටහන 2024 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන අතර මෙමගින් ඉදිරි වසර කිහිපය තුලදී පවුල් ලක්ෂ 20ක් සඳහා ඉඩකඩම් හා ගොවිබිම් අයිතිය ලැබීම තහවුරු කෙරේ.

  - **ආදායම් සුරක්ෂිතතාවය ඇති කරගැනීම**

    නාගරික නිවාස හිමිකම සහ වතුකර නිවාස.

    විවිධ නාගරික වැඩසටහන් යටතේ ඉදිකරන ලද නිවාස වල පූර්ණ අයිතිය එම අඩු ආදායම්ලාභින්ටම ලබාදීමට පියවර ගනු ඇත. මේ යටතේ 2024 වර්ෂය තුල පමණක් පවුල් 50,000 ට ආසන්න සංඛ්‍යාවකට නිවාස හිමිකම ලැබෙනු ඇත.එමෙන්ම වතුකරයේ ජනතාවට ඉඩම් හිමිකම් ලබාදීමට අවශ්‍ය පියවරද වෙනුවෙන් 2024 වර්ෂයේ මූලික කටයුතු ආරම්භ කෙරෙනු ඇත.

  - **අස්වැසුම**

    සමාජ ආරක්ෂණ වැඩසටහන් සඳහා පෙර වසරවල වැය කළ මුදල මෙන් තුන් ගුණයක් 2024 වසරෙදි දී අස්වැසුම වැඩසටහන සඳහා වියදම් කිරීමට අපෙක්ෂිත අතර ප්‍රතිලාභීන් සවි බල ගැන්වීම සඳහා සමෘද්ධි නිලධාරීන්ගේ අත්දැකීම සහ දැනුම උපයෝගී කරගනේ.

– **කඳුකර දශකය**

විවිධ හේතු නිසා සම්පත් බෙදී යාමේ විෂමතාවයන් හේතුවෙන් කඳුකර ප්‍රදේශවල පොදු යටිතල පහසුකම් හා සේවාවන්හි වර්ධනය සහ පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය සාපේක්ෂව අඩු මට්ටමක පවතින අතර මෙය මගහරවා ගැනීම සඳහා කඳුකර ප්‍රදේශවල ග්‍රාමීය සංවර්ධනයට ප්‍රමුඛතාවය දීමේ වැදගතකම හඳුනාගනිමින් සබරගමුව හා මධ්‍යම පළාත් සහ බදුල්ල, ගාල්ල, මාතර, කළුතර සහ කුරුණෑගල දිස්ත්‍රික් ඇතුළත් වන පරිදි එහි කඳුකර ප්‍රදේශවල අයත් සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 89 ඇතුලත් වන පරිදි දස වසරක බහුකාර්යය ග්‍රාමීය හා ප්‍රජා සංවර්ධන වැඩසටහනක් 2024 සිට ආරම්භ කෙරෙනු ඇත.

– **කාන්තාවන් සවිබල ගැන්වීම**

ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් වූ අයවැයකරණය හඳුන්වා දීමට හා ඒ හා සම්බන්ධ නීති සම්පාදනය කර බලාත්මක කිරීමට මෙන්ම කාන්තාවන් සවිබලගැන්වීම සඳහා වන නීති හඳුන්වා දීමට කටයුතු කෙරෙනු ඇත.

– **අවතැන් ජනතාවට නිවාස**

උතුරු නැගෙනහිර පළාත්වල තවමත් නිවාස අහිමි පවුල් සඳහා නිවාස වැඩසටහන කඩිනම් කිරීම, නිවාස නොමැතිව ඉතිරිවී ඇති පවුල් සඳහා අත්‍යවශ්‍ය සහන සැලසීම සහ වන්දි ගෙවීම් වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

– **ජාතික ජනසභාව පිහිටුවීම**

ග්‍රාමීය මට්ටමේ නොවිසඳුණු සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ඒවාට ප්‍රමුඛත්වය ලබා දෙමින් ජාතික මට්ටමින් සම්පත් වෙන් කිරීමේ ක්‍රියාවලිය අදාළ ප්‍රදේශ නියෝජනය කරන මහජන නියෝජිතයින්ගේද සම්බන්ධිකරණයෙන් ක්‍රියාත්මක කිරීමත් ජනතාව සහභාගිත්වය සහිතව විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සාමූහිකව සංවර්ධන ප්‍රමුඛතා තීරණය කර සම්පත් වෙන් කිරීමටත්, එම සංවර්ධන ප්‍රමුඛතා රජයට සෘජුවම ඉදිරිපත් කිරීමටත් අවසතාව සැලසෙන පරිදි ජාතික ජනසභා ක්‍රමය ආරම්භ කෙරෙන අතර එහි ප්‍රධාන පියවරක් ලෙස 2024 වර්ෂයේදී ජනසභා ලේකම් කාර්යාලය පිහිටුවීමට යෝජිතය.

– **තරුණ අභිවෘද්ධි වැඩසටහන**

විවිධ අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන විසින් තරුණයන්ගේ අභිවෘද්ධිය කේන්ද්‍ර කරගත් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන අතර මෙම සියලු වැඩසටහන් සම්බන්ධීකරණය කරමින් සහ නව ආර්ථික හා සමාජ තත්ත්වයන්ට ගැලපෙන නව වැඩසටහන් අන්තර්ගත ඒකාබද්ධ තරුණ අභිවෘද්ධි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

**ඊ.එම්.එස්.බී. ඒකනායක**

ජනාධිපති ලේකම්

# 03 පරිච්ඡේදය

## 2023.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 (රු.) | | සටහන | සත්‍ය 2023 (රු.) | සත්‍ය 2022 (රු.) | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 3,531,014,417 | 2,574,459,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 19,653,920 | 12,913,576 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 65,864,353 | 35,227,637 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **3,616,532,690** | **2,622,600,213** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **3,616,532,690** | **2,622,600,213** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | **132,500** | - | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **3,616,400,190** | **2,622,600,213** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ-2(ii) |
| 916,240,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 914,206,523 | 661,982,622 | ඒසීඒ-2(ii) |
| 2,377,219,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 2,268,677,304 | 1,334,804,539 | ඒසීඒ-2(ii) |
| 127,041,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 88,634,710 | 196,594,606 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 100,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 10,500 | - | ඒසීඒ-2(ii) |
| **3,420,600,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **3,271,529,037** | **2,193,381,767** | |
| | **මූලධන වියදම්** | | | | |
| 429,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 404,186,792 | 348,995,333 | ඒසීඒ-2(ii) |
| 139,200,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 138,374,673 | 149,143,452 | ඒසීඒ-2(ii) |
| 3,868,600,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 3,615,517,651 | 195,458 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 2,600,000 | හැකියා වර්ධනය | 14 | 2,579,249 | 394,000 | ඒසීඒ-2(ii) |
| 500,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 370,897,472 | 40,214,031 | ඒසීඒ-2(ii) |
| **4,939,400,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **4,531,555,837** | **538,942,274** | |
| | තැන්පතු ගෙවීම් | | 22,490,259 | 9,041,587 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 83,890,882 | 57,418,735 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 106,381,141 | **66,460,322** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **7,909,466,015** | **2,798,784,363** | |
| **8,360,000,000** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(4,293,065,825)** | **(176,184,150)** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශය අනුව ශේෂය** | | **(4,293,065,825)** | **(176,184,150)** | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | | - | ඒසීඒ-3 |
| | | | **(0)** | - | |

ඒසීඒ -පී

| 2023.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ -6 | 42,352,274,582 | 41,798,206,152 |
| කල්බදු ආයෝජන | | 19,808,524 | 89,541,533 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ -5/5(ඒ) | 115,062,031 | 97,035,503 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ -3 | - | - |
| **මුළු වත්කම්** | | **42,487,145,137** | **41,984,783,188** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 105,959,001 | 85,096,134 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 42,352,274,582 | 41,798,206,152 |
| කල්බදු වගකීම් | | 19,808,524 | 89,541,533 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ -5(බී) | | - |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ -4 | 9,103,030 | 11,939,369 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ -3 | - | - |
| **මුළු වගකීම්** | | **42,487,145,137** | **41,984,783,188** |

පිටු අංක **11** සිට **64** දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 65 සිට 116 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
|---|---|---|
| නම : ඊ.එම්.එස්.බී. ඒකනායක | නම : ඊ.එම්.එස්.බී. ඒකනායක | නම : කාංචනා ලියනපතිරණ |
| තනතුර : ජනාධිපති ලේකම් | තනතුර : ජනාධිපති ලේකම් | |
| දිනය : 2024.02.14 | දිනය : 2024.02.14 | දිනය : 2024.02.14 |

ඒසීඒ -සී

## 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | තතාය | |
|---|---|---|
| | 2023 | 2022 |
| | රු. | රු. |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | |
| ලාභ | | |
| ආදායම් නොවන ලැබීම් | | |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 47,290,887 | 23,119,158 |
| අග්‍රිම ලැබීම් | 3,531,014,417 | 2,574,459,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 91,784,771 | 61,515,365 |
| තැන්පතු ලැබීම් | 19,653,695 | 12,913,626 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **3,689,743,770** | **2,672,007,149** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 2,776,257,316 | 1,867,021,543 |
| සහනාධාර සහ මාරුකිරීම් | 88,571,810 | 190,689,573 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 36,411,270 | 48,265,983 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 132,500 | - |
| අත්තිකාරම් ගෙවීම් | 85,615,210 | 58,054,750 |
| තැන්පතු ගෙවීම් | 22,490,034 | 9,041,637 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **3,009,478,140** | **2,173,073,486** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **680,265,630** | **498,933,662** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **-** | **-** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| මූලධන වියදම් | 680,265,630 | 498,933,662 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **680,265,630** | **498,933,662** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(680,265,630)** | **(498,933,662)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **-** | **-** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

**වාර්තාකිරීමේ පදනම**

I. **වාර්තාකරණ කාලපරිච්ඡේදය;**

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

II. **මිනුම්කරණ පදනම;**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

III. **ආදායම් හඳුනාගැනීම;**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

IV. **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම;**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

V. **දේපළ, පිරියත හා උපකරණ සංචිතය;**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

VI. **මුදල් හා මුදල් සමාන දෑ;**

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය: අදාළ නැත

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 2,800,200 | 3,420,600 | 3,271,529 | 96% |
| මූලධන | 987,800 | 4,939,400 | 4,531,555 | 96% |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අං. | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් ප්‍රතිපාදනවල % ගණන |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| 1 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 75 වන නිදහස් සමරු උළෙල - 2023 | 21,000,000.00 | 6,497,000.00 | 27,496,289.97 | 100% |
| | | ඩබ්ලිව්.ඩී.එම්. බොතේජු මයා හා සී.කේ.සමරසිංහ මයා ගේ වැටුප් හා දීමනා ගෙවීම | 59,540.00 | 59,540.00 | 11,045.16 | 18.55% |
| 2 | බහුකාර්යය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව | ඒකාබද්ධ සේවයේ පත්වීම් භාර ගන්නා ලද බහුකාර්ය සංවර්ධන සහායකයින් ගේ වැටුප් හා දීමනා ගෙවීම | 135,000.00 | 628,548.39 | 628,548.39 | 100% |
| 3 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | විශ්‍රාම යන නිලධාරීන්ගේ ණය ශේෂ පවරා ගැනීම | 8,275,386.52 | 8,275,386.52 | 8,275,386.52 | 100% |

## 3.8 මූල්‍ය - නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 1,458,219 | 1,458,219 | නැත | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 4,909,689 | 4,909,689 | නැත | 100% |
| 9153 | ඉඩම් | 35,646,525 | 35,646,525 | නැත | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | නැත | නැත | නැත | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | නැත | නැත | නැත | - |
| 9160 | කෙරීගෙන වන වැඩ | නැත | නැත | නැත | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | 337,842 | 337,842 | නැත | 100% |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TPD/C/23/40/PO/FA    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2024 මැයි 29 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
ජනාධිපති කාර්යාලය

**ශීර්ෂය - 001 අතිගරු ජනාධිපති වැය ශීර්ෂයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** මතය

ශීර්ෂය 001 - අතිගරු ජනාධිපති වැය ශීර්ෂයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අතිගරු ජනාධිපති වැය ශීර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අතිගරු ජනාධිපති වැය ශීර්ෂයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සුහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශය පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

2023 වර්ෂය සඳහා ජනාධිපති කාර්යාලය සැලසුම් කරන ලද අග්‍රිම වටිනාකම රු.3,789,760,000 ක් වුවද භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කරන ලද අග්‍රිම වටිනාකම රු.3,595,249,000 ක් වූ නිසා රු.194,513,000 ක විචල්‍යතාවයක් නිරීක්ෂණය විය.

### 2.2 වියදම් කළමනාකරණය

#### 2.2.1 ප්‍රතිපාදන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් තුනක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන එකතුව රු.3,000,000 කින් වර්ෂය තුල කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ ඇස්තමේන්තු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් දෙකක වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් එකතුව රු.2,500,000 ක් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයන්ට මාරු කළ පසුද ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.530,086 ක් හෙවත් සියයට 21 සිට 85 දක්වා පරාසයන් තුල ඉතිරි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) වැය විෂයයන් හයක ඇස්තමේන්තු ප්‍රතිපාදන එකතුව රු.44,600,000 කින් සියයට 28 සිට 90 දක්වා පරාසයක් තුල එකතුව රු.22,477,493 ක් ඉතිරි කර තිබුණි.

(ඈ) වැය විෂයයන් 14 ක එකතුව රු.1,149,000,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට 86 ත් අතර ප්‍රමාණයකින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මුදල් රෙගුලාසි 66 මඟින් මාරු කර තිබුණි.

(ඉ) වැය විෂයයන් දෙකක එකතුව රු.3,500,000 ක් වූ මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම මු.රෙ.66 මඟින් වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි.

4

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**2.2.2 වැය විෂයයන් සඳහා අමතර ප්‍රතිපාදන සලසා ගැනීම**

(අ) වැය විෂයයන් 15 ක් සඳහා ප්‍රමාණවත් පරිදි වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කර නොගැනීම නිසා මුල් ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට 456 ක පරාසයකින් මුදල් රෙගුලාසි 66 මඟින් එකතුව රු.223,855,000 කින් ප්‍රතිපාදන වැඩි කරගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) වැය විෂයයන් 06 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයට අමතරව මු.රෙ. 66 හා පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් එකතුව රු.801,500,000 ක ප්‍රතිපාදන සලසාගෙන සියයට 49 සිට සියයට 3648 දක්වා පරාසයකින් ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි.

(ඇ) වැය විෂයයන් 06 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයට පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් රු.261,300,000 ක ප්‍රතිපාදන සලසාගෙන ප්‍රතිපාදන වැඩිකර ගැනීම නිසා සියයට 15 සිට සියයට 140 ක පරාසයකින් ප්‍රතිපාදන වැඩිවී තිබුණි.

(ඈ) වාර්ෂික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා නොමැති ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සඳහා පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් රු.43,400,000 ක් ද ලෝක ආහාර සහනාධාර වැඩසටහන සඳහා රු. 3,868,600,000 ක් ද ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

(ඉ) පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගත් වැය විෂයයන් අටක, වියදම් නොකර රු.253,481,202 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 90 අතර පරාසයක පැවතුණි.

**2.3 බැඳීම් හා බැරකම්**

ජනාධිපති ලේකම් කාර්යාලය වෙනුවෙන් මාතලේ හා මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2018, 2019 හා 2020 වර්ෂවලදී ඇතිකර ගත් බැඳීම් හා බැරකම් එකතුව රු.16,313,724 ක් සමාලෝචිත වර්ෂයේදී ජනාධිපති ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන වල ඇමුණුම් iii හි බැඳීම් හා බැරකම් ලෙස දක්වා තිබුණි.

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ.106 හා මු.රෙ.113 ප්‍රකාරව | (i) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ඇමුණුම (i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය අනුව සිද්ධීන් 05 ක අලාභ හා පාඩු එකතුව වූ රු.3,954,820 ක් හානි හා පාඩු ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි.<br>(ii) දේපල හා භාණ්ඩ වලට අදාලව සිදුවූ අලාභ හානි හා පාඩු එකතුව රු 3,954,820.ක් සම්බන්ධයෙන් මු.රෙ.104 යටතේ පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණු අතර එය තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය යටතේ දැක්විය යුතු විය. |
| (ii) මු.රෙ.225(i) ප්‍රකාරව | සියළු ගෙවීම් සඳහා වවුචරයක් සකස් කළ යුතු වුවද ලෝක ආහාර වැඩසටහනේ බැංකු ගිණුමේ 2023 දෙසැම්බර් 29 දිනට ඉතිරිවූ මුදල් රු.92,745 ක් ජනාධිපති ලේකම් වෙත චෙක්පතකින් පියවීම් කිරීමට අදාලව වවුචරයක් පිළියෙල කර නොතිබුණි. |
| (iii) මු.රෙ. 315 ප්‍රකාරව, 880 හා 881 ප්‍රකාරව | 2023 වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලයේ ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැන්පත් කිරීම සිදු කර නොතිබුණි. |
| (iv) මු.රෙ. 371(2) ප්‍රකාරව | කාර්යය නිමකළ වහාම තත්කාර්ය අතුරු අග්‍රිම නැවත පියවිය යුතු වුවත් මෙම කාර්යාලයේ 2023 අගෝස්තු මාසය වනවිට අවස්ථා 16 ක දී ලබාගත් අත්තිකාරම් පියවීම සඳහා මාස 02 කට හෝ ඊට වැඩි කාලයක් ගතවී තිබූ බව නිරීක්ෂණය විය. |
| (v) මු.රෙ. 371(4) ප්‍රකාරව | නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබානොගත යුතු වුවද කාර්යාලයේ අවස්ථා 03කදී තත්කාර්ය |

6

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | |
|---|---|
| | අතුරු අග්‍රිම ලබාගෙන කිසිදු කාර්යයකට නොගෙන නැවත මුදලින් පියවා තිබූ බව නිරීක්ෂණය විය. |
| (ආ) වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 හා 2018 දෙසැම්බර් 31 දිනැති චක්‍රලේඛය අනුව මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශය | (i) ජනාධිපති කාර්යාලයට අයත් ජනාධිපති කාර්යාලය හා ජනාධිපති මන්දිර 3 ක් හා ඊට අදාල ඉඩම් විගණිත දිනය වූ 2023 නොවැම්බර් 30 දින වන විටත් තක්සේරු කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.<br><br>(ii) ගාලුමුවදොර, කොළඹ 01 හි පිහිටි ජනාධිපති කාර්යාලය හා ඇඹිලිපිටිය ජනාධිපති මන්දිරයට අයිති ඉඩමේ භූමි ප්‍රමාණ සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මිනුම් කර නොතිබුණි. |
| (ඇ) වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 හා 2018 දෙසැම්බර් 31 දිනැති චක්‍රලේඛයේ 1:3:1 ඡේදය හා ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) ගේ අංක PS/IAD/TR/Q/ Insurance/2024/25 හා 2023 ඔක්තෝබර් මස 21 දිනැති ලිපිය | සියළුම වාහන සඳහා වර්ෂ 05 කට වරක් තක්සේරුවක් ලබා ගැනීම අනිවාර්යය වුවද ජනාධිපති කාර්යාලයේ වාහන සමාලෝචිත වර්ෂය තුලදී චක්‍රලේඛ උපදෙස් පරිදි තක්සේරු කිරීමක් සිදුකර නොතිබුණි. |
| (ඈ) අංක 05/2023 රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය | (i) භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශය (SA-52) අනුව 2023 වර්ෂයේ අත්තිකාරම් ලැබීම් රු.66,932,960 ක් ද අත්තිකාරම් ගෙවීම් රු.84,959489 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පිළිවෙලින් රු.65,864,353 ක් හා රු.83,890,882 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී SA-52 පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.<br><br>(ii) මූල්‍ය ප්‍රකාශන වල (ACA-5 ආකෘතිය) අත්තිකාරම් 'බී' ගිණුම භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA-52 හි වටිනාකම් දක්වා පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව පිළියෙල කර නොතිබුණි. |

7

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**2.5 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**

පහත කරුණු නිරීක්ෂණය විය.

රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් පිළිබඳව පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විශ්‍රාම ගිය රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරියෙකුගේ හා උද්‍යාන කම්කරු මහතකුගෙන් ලැබීමට ඇති පිළිවෙලින් දේපල ණය රු.144,768 ක් හා ආපදා ණය රු.114,655 ක් වර්ෂ 10-20 අතර කාලයක් තුල හිඟව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) සේවය අතහැර ගොස් ඇති රාජ්‍ය කළමනාකරණ සහකාර සේවක නිළධාරියකුගේ රු.236,974 ක ආපදා ණය ශේෂය වර්ෂ 3ත් 5ත් අතර කාලයක් තුල අය නොවී සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) වර්ෂ තුනත් පහත් අතර කාලයක් තුල සේවය අතහැර ගොස් ඇති කාර්යාල කාර්ය සහායක මහතකුගෙන් ලැබීමට ඇති එකතුව වූ රු. 204,944 ක ආපදා ණය හා පාපැදි ණය ශේෂ ඇපකරු විසින් ගෙවීම් සිදුකරන ලෙස දක්වා ඇතත් සමාලෝචිත වර්ෂය තුලදී අයනොවී පැවති බව නිරීක්ෂණය විය.

(ඈ) මාස 1-3 අතර කාලයක් තුළ සේවය අතහැර ගොස් ඇති රියදුරු මහතුන් තිදෙනෙකුගෙන් රු.428,283 ක ආපදා හා උත්සව ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) අත්තිකාරම් ගිණුම සමඟ ඉදිරිපත් කර ඇති ණය කාල විශ්ලේෂණයේ විශ්‍රාම ගිය, සේවය හැරගිය, මියගිය හා ස්ථානමාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිවැරදිව දක්වා නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

**3.1.1 සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක 02/2020 හා 2020/8/28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 12 හි 03 ඡේදයේ (ඉ) අනුව සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් (ආයතන මෙහෙයුම් කටයුතු, ගොඩනැගිලි හා වාහන නඩත්තු සහ පුනරුත්ථාපන කටයුතු නොවන) වෙනුවෙන්

8

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත විය යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා ජනාධිපති කාර්යාලයේ පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම තුල අංක 001-2-6-3-2509 දරන සංවර්ධන වැඩසටහනේ රු.500,000,000 ප්‍රතිපාදන වලින් ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රසම්පාදන සැලැස්මක් ඇතුළත් කර නොතිබුණි.

(ආ) ශීර්ෂ අංක 001-2-6-3-2509 දරන සංවර්ධන වැඩසටහන වෙනුවෙන් රු.500,000,000 ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කර තිබුණි. වෙනත් ආයතන වෙත රු.239,275,587 ක් ලබා දීමෙන් ද බිල්පත් මගින් සිදුකළ ගෙවීම් සඳහා රු.131,621,885 ක් ද ඇතුළුව එකතුව රු.370,897,472 ක් වර්ෂය තුලදී වියදම දරා තිබුණි. මෙම වියදම් දැරීමෙන් ළඟා කරගත් අපේක්ෂිතයන්ගේ ප්‍රගතිය වාර්තා විගණනයට ඉදිරිපත් නොවිය.

(ඇ) ආයතන 12 ක් සඳහා ලබාදී තිබූ රු.348,654,373 ක්වූ ප්‍රතිපාදන වලින් රු.239,275,587 ක් පමණක් වියදම් දරා තිබුණි. මේ අනුව ලබාදුන් ප්‍රතිපාදනයෙන් සියයට 31 ක් හෙවත් රු.109,378,786 ක් ප්‍රතිපාදන වෙන්කළ ආයතන අටක් විසින් උපයෝජනය කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) පොතුවිල් උප ඩිපෝව, ප්‍රධාන ඩිපෝවක් බවට උපශ්‍රේණිගත කිරීම, පුත්තලම හා වවුනියාව දිස්ත්‍රික්කවල අඩක් නිමකළ පාසැල් ගොඩනැගිලිවල ඉතිරිවැඩ නිම කිරීම යන කාර්යයන් සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදන වලින් පිළිවෙලින් සියයට 40 ක් හා 76 ක් වියදම් නොකර ඉතිරිවී තිබූ බව විගණනයට නිරීක්ෂණය විය. ලබාදුන් ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය වන බව තහවුරු කර ගැනීමට හා භාවිතා නොකරන එම මුදල් වෙනත් සංවර්ධන කටයුත්තක් සඳහා හෝ යොමු කරවීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 3.1.2 සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණ වැය විෂයෙන් වියදම් දැරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 වර්ෂයේ වාර්ෂික වියදම් ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් V වන විධායක (හිටපු ජනාධිපති) ජනාධිපති සඳහා මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් සඳහා වැය විෂයය අංක 001-3-5-2001 ට රු.1,000,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද වර්ෂය තුලදී එම වැය විෂයයේ කිසිදු වියදමක් නොදරා එම සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණි. මූල්‍ය ප්‍රකාශන වල ACA2(II) හි ඉතිරිවීම් සඳහා හේතු වශයෙන් අපේක්ෂිත පරිදි වියදම් පැන

9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

නොනැගිනි බව දක්වා තිබූ නමුත් සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණ වැයවිෂයයෙන් හිටපු V වන විධායක ජනාධිපතිගේ නිල නිවාසය අළුත්වැඩියා කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවට රු.18,336,135 ක ප්‍රතිපාදන සලසා දී ඇති අතර එම නිල නිවාසයේ එක්ස්කැලේටරයක් සවි කිරීමට රු.15,093,876 ක් හා ජෙනරේටරයක් මිලට ගැනීමට රු.4,885,844 ක් වශයෙන් එකතුව රු.38,315,855 ක් දරා තිබුණි. මෙම වියදම් සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ මුළු වියදම වූ රු.370,897,472 න් සියයට 10 ක් වී තිබූ අතර වාර්ෂික අයවැය ප්‍රතිපාදන වලින් V වන විධායක ජනාධිපතිවරයාගේ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් සඳහා සලසා තිබූ ප්‍රතිපාදනය සමහ සැසඳීමේදී එම ප්‍රතිපාදනය ඉක්මවා රු.37,315,855 ක් සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණ වැය ශීර්ෂයෙන් දරා ඇති බව විගණනයට නිරීක්ෂණය විය. එක්ස්කැලේටරය හා ජෙනරේටරයක් මිලදී ගැනීම සඳහා වැයකළ මුළු පිරිවැය වූ රු.19,979,720 ක් මූලධන වත්කම් අත්පත් කර ගැනීමක් වුවද එය ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණ බව ද නිරීක්ෂණය විය. තවද, උක්ත නිල නිවාසය අලුත්වැඩියා කිරීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් 2021, 2022 හා 2023 වර්ෂවලදී රු.472,529,073 ක් ද දරා තිබූ බවත් විගණනයේදී තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණ වැය විෂය ප්‍රතිපාදන වලින් රු.45,710,216 ක් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන පාසල් තුනක ගොඩනැගිලි නවීකරණය සහ ඉදිකිරීම් සඳහා යොදාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

### 3.1.3 ආහාර සුරක්ෂිතතා අංශයේ ක්‍රියාකාරී සැලැස්ම - 2023

ආහාර සුරක්ෂිතතා යටිතල පහසුකම් ව්‍යාපෘති සම්බන්ධීකරණය හා මගපෙන්වීම අරමුණු කර ගනිමින්, අහාර සුරක්ෂිතතා යටිතල පහසුකම් ව්‍යාපෘති සංවර්ධන අංශය විසින් දේශීය මිරිස් පාරිභෝජනයට අවශ්‍ය මිරිස් එලදාව මෙරට තුල නිෂ්පාදනය කිරීම තුලින් විදේශ විනිමය ඉතිරි කර ගැනීම සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාලව එම අංශය විසින් සිදුකළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය හා පෞද්ගලික අංශයේ දායකත්වයෙන් ආරම්භ කිරීමට කටයුතු කළ මෙම ව්‍යාපෘතිය සඳහා මිරිස් වගා කිරීමට අපේක්ෂිත ගොවි මහතුන් 309 කගේ දායකත්වයක් 2023 මාර්තු මස වන විට ලැබී තිබුණි. කඩිනමින් මෙවැනි ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සහ ඒ සඳහා අවශ්‍ය වන

10

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අනෙකුත් පහසුකම් ලබා ගැනීමට ඇති අපහසුතාවය සහ මෙවැනි ව්‍යාපෘතියක් පූර්ව අත්දැකීම් වලින් තොරව ආරම්භ කිරීම ප්‍රායෝගික නොවන බව 2023 දෙසැම්බර් 06 දින නවීන තාක්ෂණය පදනම් කරගත් කෘෂි කර්මාන්තය ප්‍රචලිත කිරීමේ රැස්වීම් සාකච්ඡාවේ ගනු ලැබූ තීරණ අනුව මෙය නියමු ව්‍යාපෘතියක් ලෙස සලකා ගොවීන් 25ක් සම්බන්ධ කර ගනිමින් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බවත් නිරීක්ෂණය විය.

(ආ) වියළි මිරිස් අවශ්‍යතාවය දේශීයව සපයා ගැනීමේ කාර්යයට සාර්ථක කර ගැනීමට රාජ්‍ය බැංකු හා පෞද්ගලික ආයතන දැනුවත් කරමින් වැඩසටහන් කිහිපයක් හා රැස්වීම් කිහිපයක් පවත්වා තිබූ නමුත් ව්‍යාපෘතියට සහනදායී පොලී අනුපාත යටතේ අවශ්‍ය මූල්‍ය පහසුකම් ගොවි මහතුන් හට ලබාදීමට කිසිදු ආයතනයක් ඉදිරිපත් වී නොමැති අතර බැංකු වෙත ඊට අදාල සුරකුම් ඉදිරිපත් නොකිරීම හා ඉහල පොලී අනුපාත සහ ණය සුරකුම් ඉදිරිපත් කිරීමට ගොවීන්ටද පෞද්ගලිකව නොහැකිවීම හේතුවෙන් බැංකු පද්ධතිය හරහා ණය පහසුකම් ලබා ගැනීමට නොහැකිවී තිබුණි. 2022 නොවැම්බර් මස ආරම්භ කරන ලද මෙම වැඩසටහන 2023 වර්ෂය තුලදී ක්‍රියාත්මකවී නොතිබුණි.

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2022 වර්ෂයේ වාහන අපහරණය

වාහන අපහරණය සඳහා පත්කළ පරීක්ෂණ මණ්ඩල වාර්තාවකට අනුව වාහන 16 කින් වාහන 15 ක් අපහරණය කිරීමට තීරණය කර තිබුණු අතර 2022 ඔක්තෝබර් 30 දින ඒ සඳහා ජනාධිපති ලේකම්වරයාගේ අනුමැතිය ලබාදී තිබුණි. ඊට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අපහරණයට යෝජිත යතුරු පැදියක හා ඩබල් කැබ් රථයක ඡායාරූප වාහන අපහරණ මණ්ඩලය 2022 මාර්තු 30 දින ඉදිරිපත් කර තිබූ වාහන විස්තර පත්‍රිකාවේ ඇතුළත් කර නොතිබුණි.

(ii) කාර් රථ දෙකක ලියාපදිංචි සහතිකයන් අනුව අයිතිය පිළිවෙලින් තරුණ සවිබල ගැන්වීමේ හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා විශ්‍රාමික ජනාධිපතිවරයෙකුගේ නමින් දක්වා තිබුණි. එම වාහන වල අයිතිය ජනාධිපති

11

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ලේකම්වරයා නමින් පවරා ගැනීමකින් තොරව ඒවා වෙන්දේසි කිරීමට 2022 සැප්තැම්බර් 23 දින මණ්ඩලය නිර්දේශ කර තිබුණි.

(iii) වෙන්දේසි කිරීම සඳහා නිර්දේශ කර ඇති වාහන 07 ක් වෙන්දේසි කිරීම සඳහා කටයුතු කරන ලෙස 2023 මැයි 10 දින ප්‍රසම්පාදන අංශය වෙත දන්වා තිබූ නමුත් විගණිත දිනය වූ 2024 ජනාවාරි 31 දින වන විටත් එම කටයුතු කර අවසන් කර නොතිබුණි.

(iv) 2023 සැප්තැම්බර් 23 දින අංක යතුරු පැදි 02 පුහුණු මෙවලමක් ලෙස මාතර කාර්මික විද්‍යාලයට ලබා දීමට නිර්දේශ කර තිබුණ ද 2022 දෙසැම්බර් 30 දින මෝටර් රථ දෙපාර්තමේන්තුවේ පරීක්ෂක විසින් භෞතිකව පරීක්ෂා කරන අවස්ථාව වන විටත් එම වාහන දෙක මාතර කාර්මික විද්‍යාලයේ පැවති බව ඉදිරිපත්වූ තොරතුරු අනුව විගණනයට නිරීක්ෂණය විය.

(v) 2022 වර්ෂයේ සිට විගණිත දින වූ 2024 ජනවාරි මස වන විට වසර 02 ක කාලයක් ගත වී ඇතත් වාහන අපහරණය කටයුතු සම්පූර්ණයෙන් නිම කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2023 වර්ෂයේ වාහන අපහරණය

2023 වර්ෂයේදී දීර්ඝකාලයක සිට ධාවනයේ යෙදී ඉවත් කර ඇති වාහන අතුරින් අපහරණය කිරීමට සුදුසු වාහන හඳුනාගෙන නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලයක් 2023 අගෝස්තු මස 22 දින ජනාධිපති අතිරේක ලේකම් විසින් (පාලන හා ප්‍රවාහන) පත්කර තිබුණි. ඒ අනුව වාහන 06 ක් අපහරණය කිරීමට මණ්ඩලය මඟින් නිර්දේශ කර තිබුණි. ඉහත වාහන තක්සේරු කර ඒවායේ මිල නියම කිරීම සඳහා 2023 නොවැම්බර් 02 දින තක්සේරු කමිටුවක් පත්කර තක්සේරු වාර්තාව සති 02 ක් ඇතුලත ලබාදෙන ලෙස දන්වා තිබුණද 2023 වර්ෂයේ අවසානය වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**3.3 පාඩු හා හානි**

**3.3.1** 2022 හා 2023 වර්ෂ දෙකේදී සිදු වූ වාහන අනතුරු වලට අදාල නිරවුල් නොවූ ඉදිරියට ගෙන යන සිද්ධීන් 62 කට අදාල මුළු අලාභ වටිනාකම රු.14,549,774 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන සමඟ වූ මු.රෙ. 109 යටතේ පොතෙන් කපා හැරීම හා අයකර ගැනීම පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි.මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2022 වර්ෂය තුලදී සිදුවූ අනතුරු

(i) මු.රෙ.104(4) ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩල කටයුතු අවසන් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (i) හි දක්වා ඇති වාහන අනතුරු 13 ක් තවදුරටත් කපා නොහළ ඉදිරියට ගෙන යන එකතුව රු. 5,657,446ක ශේෂයක් විය.

(ii) මු.රෙ. 104(4) ප්‍රකාරව අනතුරක් සිදුවී මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් වාහන 07 ක් අනතුර සිදුවී මාස 13 සිට මාස 18 ක කාලයක් ගතවී ඇතත් ඊට අදාළ පරීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය.

(iii) අංක PH – 3701 දරන වාහනය 2022 අගෝස්තු 19 දින අනතුරට පත්වී 2023 දෙසැම්බර් 31 වන දින වන විට මාස 18 ක් ගතවී ඇතත් අළුත්වැඩියා සිදු කර නොමැති අතර අලුත්වැඩියා කටයුතු සඳහා නීති උපදෙස් පතා ඇති බවත් හානිය පිළිබඳ විමර්ශන කටයුතු සිදුකරන බවත් දක්වා තිබුණි 2024 .මාර්තු මස වන විටත් අලාභයේ වටිනාකම ගණනය කර නොතිබුණි.

(iv) වාහන 02 කට සිදුවූ අනතුරු සම්බන්ධයෙන් රක්ෂණයෙන් අයකර ගත නොහැකි වූ වටිනාකම එකතුව රු.341,878 ක් ජනාධිපති කාර්යාලය විසින් දරා ඇති අතර එම අනතුර සිදුවී වසරකට වැඩි කාලයක් ගතවී ඇතත් අලාභයට වගකිව යුතු පුද්ගලයන්ගෙන් තීරණය කර ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) 2022 ජූලි 09 දින වාහනයක් අනතුරකට ලක්වී තිබුණු අතර එම අනතුරෙන් වූ හානිය රු.835,475 ක් ලෙස දක්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාර සිදුකළ යුතු පරීක්ෂණය අවසන් කර නොතිබුණි.

13

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) 2023 වර්ෂය තුලදී සිදු වූ අනතුරු

විගණනය සඳහා ඉදිරිපත් කළ හානි හා පාඩු ලේඛනයට අනුව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) වාහන 34 කට අදාළව අනතුරු සිදුවී මාස 03 ත් මාස 13 ත් අතර කාලයක් ගතවී තිබුණද 2024 මාර්තු මස වන විටත් පොලිස් වාර්තා ලබාගෙන නොතිබූ අවස්ථා 34 ක් නිරීක්ෂණය විය.

(ii) මු.රෙ. 104(4) ප්‍රකාරව අනතුර සිදුවී මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් 2024 මාර්තු මස වන විට මාස 03 ක් ඉක්මවා ඇතත් වාහන 35 කට අදාළව මු.රෙ.104(4) අනුව කටයුතු නිමකර නොතිබුණු අවස්ථා 35 ක් නිරීක්ෂණය විය.

(iii) සමාලෝචිත වර්ෂය තුලදී සිදු වූ වාහන අනතුරු 24 ක් සඳහා රක්ෂණ වන්දි ලබාගැනීම හා තවදුරටත් වන්දි ලබා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව නිරීක්ෂණය විය.

(iv) 2023 වර්ෂයේදී සිදුවූ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 104(3) යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාවේ හා අවසන් වාර්තාවල පිටපතක් විගණකාධිපති වෙත යොමු කර නොතිබුණි.

(v) ඩිපෙන්ඩර් රථයක් 2023 මැයි 25 දින අනතුරකට ලක් වීමෙන් වූ අලාභය රු.2,110,400 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. මු.රෙ.104(1) (අ) අනුව ප්‍රාරම්භක පරීක්ෂණ වහාම ආරම්භ කළ යුතු වුවත් ප්‍රාරම්භක පරීක්ෂණ කර තිබුණේ 2023 සැප්තැම්බර් 15 වන දින එනම් මාස 04ප කට පසුවය. තවද 2023 සැප්තැම්බර 21 දිනැති ලිපිය අනුව මු.රෙ.104(4) අනුව වගකිවයුත්තන් නිශ්චය කිරීමේ පරීක්ෂණ මණ්ඩලයක් පත්කර පරීක්ෂණ වාර්තාව සතියක් ඇතුලත ලබා දිය යුතු බව දක්වා තිබුණද 2024 මාර්තු මස වන විටත් අවසන් වාර්තාව ලබා දීම, එම වාහනය අළුත්වැඩියා කිරීම සහ රක්ෂණ වන්දි ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(vi) කාර් රථයක් 2023 මැයි 08 අනතුරකට පත්වීමෙන් සිදු වූ අලාභය රු.596,825 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. මු.රෙ.104(1)(අ) අනුව ප්‍රාරම්භක පරීක්ෂණය වහාම ආරම්භ කළ යුතු වුවත් ප්‍රාරම්භක පරීක්ෂණ වාර්තාව මාස 05 ½ කට පසුව 2023 ඔක්තෝබර් 26 දින ඉදිරිපත් කර තිබුණි. මු.රෙ.104(4) යටතේ අවසන් පරීක්ෂණ

14

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

වාර්තාව කඩිනමින් ලබා දෙන මෙන් 2023 නොවැම්බර් 22 දින පරීක්ෂණ මණ්ඩලය වෙත දන්වා තිබුණද 2024 මාර්තු 31 දින වන විට මාස 04 ක් ගත වී තිබුණත් අවසන් පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. මු.රෙ.104(4) අනුව අලාභහානි දිනයේ සිට මාස 03 ක් ඇතුලත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත් අනතුරට ලක්වී මාස 10 කට වැඩි කාලයක් ගත වී තිබුණද පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.



බී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

15

# 04 පරිච්ඡේදය

## ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| # | ක්‍රියාකාරකම් / අයිතම | කාර්යසාධන දර්ශකය | සත්‍ය නිමැවුම (%) (අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස) | | |
|---|---|---|---|---|---|
| | | | 100-90 | 89-75 | 74-50 |
| **ජනාධිපති කාර්යමණ්ඩල ප්‍රධානී අංශය** | | | | | |
| 1 | ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය මැදිහත්වීම සහ මඟපෙන්වීම | සිදු කල මැදිහත්වීම් සංඛ්‍යාව | √ | | |
